# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை
# Annual Performance Report

# 2025

## ජනමාධ්‍ය අංශය
## வெகுசன ஊடகப் பிரிவு
## Mass Media Division

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**
**சுகாதார மற்றும் வெகுசன ஊடக அமைச்சு**
**Ministry of Health and Mass Media**

# වාර්ෂික කාර්යසාධන වාර්තාව 2025

## සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

## ජනමාධ්‍ය අංශය

වැය ශීර්ෂ අංකය : 111

2020.01.30 දින රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දෙන ලද ආකෘති පත්‍රය ප්‍රකාරව මෙම වාර්තාව සකස් කොට ඇත.

## අන්තර්ගතය


| | | | පිටුව |
|---|---|---|---|
| පරිච්ඡේදය 01 | - | ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය | 01 - 12 |
| පරිච්ඡේදය 02 | - | ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 13 - 32 |
| පරිච්ඡේදය 03 | - | වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය | 33 - 42 |
| පරිච්ඡේදය 04 | - | කාර්ය සාධන දර්ශක | 43 - 46 |
| පරිච්ඡේදය 05 | - | තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය | 47 - 52 |
| පරිච්ඡේදය 06 | - | මානව සම්පත් පැතිකඩ | 53 - 60 |
| පරිච්ඡේදය 07 | - | අනුකූලතා වාර්තාව | 61 – 70 |
| | | විගණකාධිපති වාර්තාව | 71 - 75 |

# 01 පරිච්ඡේදය

## ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

**ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය**


1.1 හැඳින්වීම

1.2 දැක්ම, මෙහෙවර, පරමාර්ථ

1.3 විෂයපථය, කාර්යයන් හා කර්තව්‍යයන්, සුවිශේෂී ප්‍රමුඛතා

1.4 සංවිධාන සටහන - 2025

1.5 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු

1.6 අමාත්‍යාංශය යටතේ ඇති ආයතන/අරමුදල්

1.7 විදේශ මූල්‍යනය මත දිවෙන ව්‍යාපෘති පිළිබඳ තොරතුරු

අ) ව්‍යාපෘතිය

ආ) දායක නියෝජිතායතනය

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම

ඈ) ව්‍යාපෘති කාල සීමාව

# 1.0 ජනමාධ්‍ය අංශය

## 1.1 හැඳින්වීම

ජනහිතකාමී සහ සංවර්ධනයට දිශානත වූ නිදහස් සහ වගකීම් සහිත මාධ්‍ය සම්ප්‍රදායක් රට තුල ස්ථාපිත කිරීම සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශය මූලිකවම අවධානය යොමු කරයි. එමෙන්ම මාධ්‍ය ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය සහ ආයතනික සහය ලබාදීමත්, දේශීය ජනමතය ධනාත්මක දිශානතියකට යොමු කළ හැකි වගකීම් සහගත මාධ්‍ය භාවිතය දිරිගැන්වීමත් අමාත්‍යාංශය විසින් අඛණ්ඩව සිදු කරනු ලැබේ. එමෙන්ම, මාධ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රගතිය ප්‍රමාණාත්මක වර්ධනයට පමණක් සීමා නොවී ගුණාත්මක දියුණුවක්ද සමඟින් සිදුවිය යුතු බව අමාත්‍යාංශය තරයේ විශ්වාස කරනු ලබයි.

වර්තමාන මාධ්‍ය ක්ෂේත්‍රයේ දියුණුව සාම්ප්‍රදායික මාධ්‍ය භාවිතයන්ට පමණක් සීමා නොවී, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය මත පදනම් වූ නව මාධ්‍ය පරිසරයක් වෙත විහිදී ඇත. එමනිසා ජනමාධ්‍ය අංශයේ විශේෂ අවධානය සමාජ මාධ්‍ය ඇතුළු නව මාධ්‍ය මෙවලම් නිසි අයුරින් භාවිතා කිරීම පිළිබඳ දැනුම හා අවබෝධය ජනතාව හා මාධ්‍යවේදීන් අතර ව්‍යාප්ත කිරීම, ඵලදායී සන්නිවේදන ක්‍රමවේද ප්‍රවර්ධනය කිරීම සහ ඩිජිටල් තාක්ෂණික වෙනස්කම්වලට අනුගත වීමට අවශ්‍ය මාර්ගෝපදේශ සහ සහය සැපයීම සඳහා යොමු කර ඇත.

ජාතික ආර්ථිකයට බලපෑම් ඇති කරමින් අඛණ්ඩ මූල්‍ය අලාභ වාර්තා කරන සහ පවතින සම්පත් ප්‍රමාණවත් ලෙස භාවිතා නොකරන රජයේ මාධ්‍ය ආයතන ප්‍රතිසංවිධානය කර කාර්යක්ෂම තත්ත්වයට පත්කිරීමේ වගකීම ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පැවරී ඇති ප්‍රධාන අභියෝගයකි. ඒ අනුව එම ආයතනවල ව්‍යාපාරික ක්‍රියාකාරීත්වය සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳ පුළුල් ඇගයීමක් සිදු කරමින්, සකස් කරන ලද උපායමාර්ගික සැලසුම් නියමිත කාලසීමාවන් තුළ ක්‍රියාත්මක කර අපේක්ෂිත ප්‍රතිඵල අත්කර ගැනීමේ වගකීම අදාළ කළමනාකාරීත්වයන් වෙත පවරා ඇති අතර අමාත්‍යාංශය විසින් මෙම ක්‍රියාවලියේ ප්‍රගතිය නිරීක්ෂණය කරමින් අධීක්ෂණය හා මඟපෙන්වීම සිදු කරනු ලැබේ.

මාධ්‍ය ක්ෂේත්‍රය නව දිශානතියකට යොමු කිරීම අරමුණු කොට ගනිමින් ශක්තිමත් හා වගවන මාධ්‍ය ප්‍රතිපත්ති රාමුවක් ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීම උදෙසා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජාතික මාධ්‍ය ප්‍රතිපත්තිය (National Media Policy) සකස් කරන ලදී. රජයේ මාධ්‍ය ප්‍රධානීන්, විශ්ව විද්‍යාල ආචාර්යවරුන්, ක්ෂේත්‍රයේ ප්‍රධානීන්, නීතිඥයන්, විද්‍යුත් විකාශකයන්ගේ සංගමයේ නියෝජිතයන් මෙන්ම උතුර හා නැගෙනහිර පළාත් නියෝජනය කරන මාධ්‍ය සංගම්ගෙන්ද සමන්විත ස්වාධීන පළාත් කමිටුවක් පත්කොට එම පළාත් කමිටුව විසින් මෙම ජාතික මාධ්‍ය ප්‍රතිපත්තිය මේවන විට සකස් කර අවසන් කර ඇත

එමෙන්ම මාධ්‍ය ආචාරධර්ම (Media Ethics) පද්ධතියක අවශ්‍යතාවය මෙම අමාත්‍යාංශය හඳුනාගෙන ඇති අතර ඒ සම්බන්ධයෙන්ද කටයුතු ආරම්භ කර ඇත.

ඉහළ වෘත්තීයමය නිපුණතා සහිත මාධ්‍ය වෘත්තිකයන් බිහිකිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව රාජ්‍ය අනුග්‍රහය සහිත ජනමාධ්‍ය උසස් අධ්‍යාපන ආයතනයක් 'ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයින්ගේ

ආයතනය' (Chartered Institute of Media Professionals of Sri Lanka) යන නමින් පිහිටුවීමට අවශ්‍ය නීතිමය පසුබිම සකස් කෙරෙමින් පවතී. මෙම ආයතනය තුළින් ජනමාධ්‍යවේදීන් සඳහා වරලත්භාවය පිරිනැමීමට අපේක්ෂිතය.

ශ්‍රී ලාංකේය ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීයභාවය ඉහළ නැංවීම අරමුණු කරගනිමින් 'ඇසිදිසි' ජනමාධ්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන වාර්ෂිකව ක්‍රියාවට නංවනු ලැබේ. අයදුම්කරුවන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් ජනමාධ්‍යවේදීන් සඳහා නිකුත් කරන ජනමාධ්‍යවේදී හැඳුනුම්පත ලබා තිබිය යුතුය. උපාධි හෝ පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා රුපියල් 200,000/ මුදලක්ද සහතිකපත්‍ර පාඨමාලාවක් හැදෑරීම සඳහා රුපියල් 100,000/ මුදලක්ද මෙම ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය මගින් ලබා දේ.

ජාතික ආරක්ෂාවට සහ සංහිඳියාවට තර්ජනයක් නොවන අයුරින් පුවත් වෙබ් අඩවි පවත්වාගෙන යාම වැදගත් කොට සලකන බැවින් මෙම වෙබ් අඩවි ලියාපදිංචි කිරීමේ හා අලුත් කිරීම ස්වාධීන කමිටුවක් මගින් සිදු කෙරේ.

මාධ්‍යවේදීන් විසින් ඉටුකරනු ලබන මෙහෙවර සහ ඔවුන්ගේ දායකත්වය අගයකිරීමත්, ගුණාත්මක මාධ්‍ය සංස්කෘතියක් ඇති කිරීම සඳහාත් ජනාධිපති මාධ්‍ය සම්මාන උළෙල මෙම වර්ෂයේදී පවත්වන ලදී.

ශ්‍රී ලංකාව තුළ ගුවන්විදුලි හා විකාශන විෂයයන්ට බලපාන මූලික ව්‍යවස්ථාවන් වනුයේ 1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා පනත හා 1982 අංක 06 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතය. මෙම පනත්වල ප්‍රතිපාදන අනුව පෞද්ගලික රූපවාහිනී හා ගුවන්විදුලි විකාශන සේවාවන් පවත්වාගෙන යාම සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින් බලපත්‍ර ලබාදීම සිදු කරයි.

විකාශන බලපත්‍රයන්හි ඒකමතිකභාවයක් ඇති කිරීම සඳහා පොදු ආකෘතියක් හඳුන්වාදීමට කටයුතු සිදු කරන ලද අතර, සකස් කරන ලද පොදු ආකෘති පත්‍රය නීතිපති අනුමැතිය ලබාගැනීම සඳහා ඉදිරිපත් කර ඇත.

තවද, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ගුවන්විදුලි වර්ණාවලියේ උපරිම ධාරිතාවේ සීමාව ඉක්මවා ඇති බැවින් මෙම අමාත්‍යාංශය මඟින් ගුවන්විදුලි නාලිකා සඳහා බලපත්‍ර නිකුත් කිරීමක් දැනට සිදු නොකෙරේ.

එසේම, ශ්‍රී ලංකාව තුල ඩිජිටල් භෞමික රූපවාහිනී විකාශන (DTTB) ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන බැවින්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව යටතේ රූපවාහිනී නාලිකා භෞමිකව ක්‍රියාත්මක කිරීම සඳහා සංඛ්‍යාත වර්ණාවලියෙන් සංඛ්‍යාත වෙන් කිරීමේ ක්‍රියාවලිය 2025.11.01 දින සිට අත්හිටුවීමටත්, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් 2025.11.01 දින සිට බලපැවැත්වෙන පරිදි රූපවාහිනී නාලිකා භෞමිකව ක්‍රියාත්මක කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය අත්හිටුවීමටත් මෙම අමාත්‍යාංශය හා ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය විසින් එක්ව ඉදිරිපත් කරන ලද අංක. MMI/Ad2/16/2025/1-XLIV හා 2025.10.20 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අංක

අමප/25/2167/815/147 හා 2025.12.02 දිනැතිව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ අනුව මෙම අමාත්‍යාංශය මඟින් රූපවාහිනී විකාශන බලපත්‍ර නිකුත් නොකෙරේ.

කාලීන අවශ්‍යතාවයන්ට අනුගත වෙමින් ජනමාධ්‍ය අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ඇති ආයතනවලට අදාළ යල්පැන ගිය අණපනත් සංශෝධනය කිරීමේ කටයුතු අඛණ්ඩව සිදු වේ. අදාළ නීති වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කිරීම තුළින් එම ආයතන මාධ්‍ය ක්ෂේත්‍රයේ පවත්නා දැඩි තරගකාරීත්වයට සාර්ථකව මුහුණදීමට හැකි වන පරිදි ශක්තිමත් වනු ඇත.

විදේශීය ටෙලි නාට්‍ය හා චිත්‍රපට මෙරට මාධ්‍යයන්හි විකාශය කිරීම සඳහා අනුමැතිය ලබා දීම විද්වත් මඩුල්ලක් මඟින් අඛණ්ඩව සිදු කෙරේ.

ප්‍රවෘත්ති වෙබ් අඩවි ලියාපදිංචි කිරීම සහ ආනයනය කරන ලද ටෙලි නාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩසටහන් සඳහා බදු අයකිරීම මගින් ජනමාධ්‍ය අමාත්‍යාංශය මහා භාණ්ඩාගාරයට ආදායම් උපයා දෙනු ලැබේ.

භෞමික රූපවාහිනී විකාශනය ප්‍රතිසම (Analog) ක්‍රමවේදයේ සිට අංකිත (Digital) ක්‍රමවේදය දක්වා ගමන් කරන ගෝලීය ප්‍රවණතාවයට ශ්‍රී ලංකාව ද අනුගත විය යුතුය. ප්‍රතිසම තාක්ෂණය භාවිතයෙන් සංඛ්‍යාත පරාසය අපතේ යාමක් සිදුවන අතර එම සංඛ්‍යාත පරාස අනෙකුත් විදුලි සංදේශ සේවාවන්ට යොදා ගැනීමට ඇති හැකියාව මගහැරී ඇත. මේ අනුව ජපාන සහන ණය ගිවිසුමක් මගින් ශ්‍රී ලංකාවේ භෞමික රූපවාහිනී විකාශනය අංකිත කිරීමේ ව්‍යාපෘතිය' (Digital Terrestrial Television Broadcasting – DTTB Project) ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී.

'Clean Sri Lanka' වැඩසටහනට අදාළව අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ආයතන සඳහා වැඩසටහන් හඳුනාගැනීමට ජනාධිපති ලේකම් කාර්යාලයේ විශේෂ මැදිහත්වීම මත අමාත්‍යාංශය විසින් අවශ්‍ය දැනුවත් කිරීම් සිදු කරන ලදී. ඒ අනුව 'Clean Sri Lanka' වැඩසටහනෙහි පරමාර්ථ ඉටුවන ආකාරයට වැඩසටහන් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා ලදී.

එමෙන්ම ජනාධිපති ලේකම් කාර්යාලයේ ස්ථාපිත කොට ඇති 'Clean Sri Lanka' ලේකම් කාර්යාලයෙහි අරමුදල් භාවිතා කරමින් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව මඟින් 'Healthy Food – Happy Life සුවදායි දිවියකට සෞඛ්‍යමත්/ සුරක්ෂිත ආහාර' ජාතික මාධ්‍ය ව්‍යාපෘතියත්, ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය මඟින් 'Take Care - සුරකෙමු මහතොට' ව්‍යාපෘතියත්, ක්‍රියාත්මක කරන ලද අතර ඒ සඳහා ජනමාධ්‍ය අංශය මඟින් අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය වන 'පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්' හි ජනමාධ්‍ය අංශය සඳහා වන වසර 5ක උපායක්‍රමික ක්‍රියාත්මක සැලැස්ම සකස් කරන ලදී. ඒ මත පදනම්ව ජනාධිපති ලේකම් කාර්යාලයේ මැදිහත්වීමෙන් සිදුවන අධීක්ෂණ හා නියාමන ක්‍රියාවලිය හා සම්බන්ධ වෙමින් වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් මත පදනම්ව අදාළ ක්‍රියාකාරකම් ඉටු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

## 1.2 දැක්ම, මෙහෙවර, පරමාර්ථ

**දැක්ම**

'මනාව දැනුම්වත් වූ, බහුමතික සහ සක්‍රීය සමාජයක්'

**මෙහෙවර**

'ජනහිතකාමී වූ, සංවර්ධනයට දිශානත වූ, නිදහස් සහ වගකීම් සහිත ශ්‍රී ලාංකේය ජනමාධ්‍ය කලාවක් ස්ථාපිත කිරීම සඳහා ප්‍රතිපත්ති හා උපාය මාර්ග සැකසීම, පහසුකම් සැලසීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා පසු විපරම'

**පරමාර්ථ**

- වඩා යහපත් මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැංවීම සඳහා අවශ්‍ය සහාය ලබා දීම.
- මහජනතාවට තොරතුරු වෙත ප්‍රවේශවීමේ සමාන අවස්ථාවන් පුළුල් කිරීම.
- නවීනතම තාක්ෂණය සමඟ මාධ්‍ය ක්ෂේත්‍රය වෙත පහසුකම් සැලසීම.
- මාධ්‍යවේදීන්ගේ වෘත්තීයභාවය ඉහළ නැංවීම උදෙසා දිරිගැන්වීම.
- ජාතික සංවර්ධන ප්‍රයත්නයේදී මාධ්‍ය දායකත්වය සහ සහභාගීත්වය ඉහළ නැංවීම.
- ජාත්‍යන්තර වශයෙන් රටෙහි ප්‍රතිරූපය ඔප්නැංවීම උදෙසා නායකත්වය සැපයීම.
- අමාත්‍යාංශයේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා මානව සම්පත සංවර්ධනය කිරීම.
- අමාත්‍යාංශයේ අනුබද්ධිත ආයතනයන්හි සම්පත් සාර්ථකව ප්‍රයෝජනයට ගැනීම.
- අදාළ පාර්ශවයන් සම්බන්ධීකරණය කිරීම තුළින් සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.

## 1.3 විෂයපථය, කාර්යයන් හා කර්තව්‍යයන්, සුවිශේෂී ප්‍රමුඛතා

### 1.3.1 විෂය පථය

භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස ඇතුළුව නිවැරදි තොරතුරු දැනගැනීමේ ජනතා අයිතිය තහවුරු කරන තොරතුරු දැනුම හා මතවාදයන් සමබර සන්නිවේදනයක් සඳහා උචිත ජනමාධ්‍ය සංස්කෘතියක් ඇති කිරීම මෙන්ම රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා 'විනිවිදභාවයෙන් යුතු ජනමාධ්‍ය සංස්කෘතියක් හඳුන්වාදීම' සඳහා නියමිත නීති සහ අණ පනත්වලට අනුකූලව ජනමාධ්‍ය විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

### 1.3.2 කාර්යයන් හා කර්තව්‍යයන්

- රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ජනමාධ්‍ය විෂයයට සහ අදාළ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම.
- නාස්තිය හා දූෂණය පිටු දකිමින් අංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලු ක්‍රම සහ විධි සුදුසු පරිදි යථාවත් කිරීම.
- ජනතාවගේ නිවැරදි තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- රජයේ මුද්‍රණ හා ප්‍රකාශන කටයුතු සිදු කිරීම.
- ජනතාවගේ දැනුම ආකල්ප හා රසඥතාවය දියුණු කරමින් ආර්ථික, සාමාජීය, සංස්කෘතික දියුණුව සඳහා ජනමාධ්‍යයෙහි දායකත්වය ලබා දීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායයන් සම්පාදනය කිරීම.
- මාධ්‍ය භාවිතය සඳහා නවීන තාක්ෂණය යොදාගැනීම වර්ධනය කිරීම.
- ජනමාධ්‍ය ප්‍රතිපත්තියක් හඳුන්වා දීම.
- රාජ්‍ය නිල නිවේදන හා ප්‍රවෘත්ති පිළිබඳව ජනතාව දැනුම්වත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- ශ්‍රී ලංකාව පිළිබඳ අදාළ තොරතුරු දේශීය හා විදේශීය ජනමාධ්‍ය ආයතනවලට නිකුත් කිරීම.
- විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට අවශ්‍ය තොරතුරු හා ප්‍රචාරක සේවා සැපයීම.
- ප්‍රවෘත්ති, චිත්‍රපට හා වාර්තාමය වැඩසටහන් නිෂ්පාදනය හා ප්‍රදර්ශනය කිරීම පිණිස උචිත ක්‍රියාමාර්ග ගැනීම.
- වාණිජ රූපවාහිනී හා ගුවන් විදුලි ප්‍රචාර සහ විදේශ විකාශයන් ඇතුළු ප්‍රචාරක කටයුතු සිදු කිරීම.
- නවතම තාක්ෂණය සහ කළමනාකරණ ක්‍රමවේදයන් භාවිත කරමින් විවිධත්වය තුළින් ව්‍යාපාර අරමුණු කර ගත් නවීන තැපැල් සේවයක් ලබාදීම සහ දේශීය හා විදේශීය තැපැල් සේවා කටයුතු කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම.
- ලංකා මුද්දර කාර්යාංශය පරිපාලනය කිරීම.
- දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවලට පැවරී ඇති අනෙකුත් සියලු විෂයයන්ට අදාළ කටයුතු පවත්වාගෙන යාම.
- අමාත්‍යාංශයේ විෂය පථය යටතට ගැනෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා අධීක්ෂණය කිරීම.


### 1.3.3 සුවිශේෂී ප්‍රමුඛතා

- විනිවිදභාවයෙන් යුත් ජනමාධ්‍ය ප්‍රතිපත්තියක් හඳුන්වා දීම.
- ජාතික හා ජාත්‍යන්තර නීති රෙගුලාසිවලට අනුගත වන පරිදි මාධ්‍ය ප්‍රමිතීන් ස්ථාපිත කිරීම.
- ජනමාධ්‍යවේදීන් සහ ජනමාධ්‍ය ආයතන සඳහා සමාජ සංස්කෘතික වටිනාකම් සහ සමාජ සාරධර්ම පිළිබඳ රාමුව ඉක්මවා නොයන පරිදි කටයුතු කිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම.

- ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම.
- මාධ්‍යවේදීන්ට පහසුකම් සැපයීම සඳහා පළාත් මට්ටමෙන් කටයුතු සිදු කිරීම.
- ශ්‍රී ලංකා තැපැල් සේවය ජනතා අවශ්‍යතා සඳහා පුළුල් කිරීම.
- සමාජ මාධ්‍ය ඇතුළු නව මාධ්‍ය භාවිතය සහ හැසිරවීම පිළිබඳ වෘත්තීමය දැනුම හා අවබෝධය ලබා දීම සඳහා සමාජ අධ්‍යාපන ක්‍රමවේදයක් හඳුන්වා දීම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල ජනමාධ්‍ය උසස් අධ්‍යාපන වෘත්තීමය කුසලතා ප්‍රවර්ධන අවස්ථාවන් ඇති කිරීම.
- නව තාක්ෂණය පදනම්ව කාර්යක්ෂම හා නව අවස්ථාවන්ට ඉලක්කගත වූ ජනතා කේන්ද්‍රීය ඩිජිටල් තැපැල් හා ආශ්‍රිත සේවාවන් සඳහා අවශ්‍ය ක්‍රමවේදයන් හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම.

**1.4 සංවිධාන සටහන - 2025**

# ජනමාධ්‍ය අංශය



**1.5 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

i) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
ii) රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
iii) ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව

**1.6 අමාත්‍යාංශය යටතේ ඇති ආයතන**

i) තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව
ii) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව
iii) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව
iv) සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය
v) සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
vi) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
vii) ශ්‍රී ලංකා පදනම
viii) ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
ix) සීමාසහිත ලංකා පුවත් ආයතනය
x) ශ්‍රී ලංකා මාධ්‍ය පුහුණු ආයතනය
xi) සැලසිනෙ මීඩියා සොලූෂන් (පෞද්) සමාගම

**1.7 විදේශ මූල්‍යනය මත දිවෙන ව්‍යාපෘති පිළිබඳ තොරතුරු**

අ) ව්‍යාපෘතියේ නම : ශ්‍රී ලංකාවේ භෞමික රූපවාහිනී විකාශනය අංකිත කිරීමේ ව්‍යාපෘතිය
ආ) ආධාර ලබා දෙන ආයතනය : ජපාන රජය (JICA ආයතනය)
ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය : ජපන් යෙන් මිලියන 17,222
(JICA ආයතනයේ දායකත්වයේ වටිනාකම ජපන් යෙන් මිලියන 13,717 ක්ද ශ්‍රී ලංකා රජයේ දායකත්වය ජපන් යෙන් මිලියන 3,505 ක්ද වශයෙනි.)
ඇ) ව්‍යාපෘති කාලය : 2021 - 2028

# 02 පරිච්ඡේදය

## ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 ජයග්‍රහණ - ප්‍රගතිය හා ඉදිරි දැක්ම - 2025

### 2.1.1. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව මගින් 2016.08.04 දින සිට බලාත්මක වූ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මක කර එය සමාජගත කිරීම සම්බන්ධයෙන් වන වගකීම ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පැවරී ඇත. 2017.02.03 දින සිට මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ අතර රජයේ නිල තොරතුරු ජනතාවට දැනගැනීමේ අයිතිය තහවුරු කිරීමෙන් රටේ ප්‍රජාතන්ත්‍රවාදය හා යහපාලන මූලධර්ම මනාව ක්‍රියාවට නැංවීමත් එමගින් දූෂණයෙන් තොර යහපත් වගකීම් සහිත රාජ්‍ය සේවාවක් ස්ථාපිත කිරීමත් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි මූලික පරමාර්ථය විය. මෙම පනත සමාජගත කිරීම උදෙසා 2017 වසරේ සිටම ජනමාධ්‍ය අමාත්‍යාංශය අඛණ්ඩව සක්‍රීය ලෙස දායක විය.

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත අනුව ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම හා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව හා සම්බන්ධීකරණ කටයුතු අමාත්‍යාංශය මගින් සිදු කරනු ලැබේ.

එමෙන්ම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ප්‍රකාරව සහ තොරතුරු ඉල්ලීමේ ක්‍රමවේදයට අනුව කොමිෂන් සභාව සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී. මේ වන විට වාර්ෂික වාර්තා සහ අර්ධ වාර්ෂික වාර්තා මෙන්ම ද්විමාසික තත්ත්ව වාර්තා 7ක් තොරතුරු කොමිසම වෙත යොමු කර ඇත. එමෙන්ම පුරවැසියන් හෝ පොදු අධිකාරීන් විසින් කොමිෂන් සභාව වෙතින් ඉටුකළ යුතු කාර්යයන් සම්බන්ධවත් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ විවිධ ඉල්ලීම්ද අදාළ බාහිර ආයතන වෙත යොමු කිරීම සිදු කර ඇත.

### 2.1.2. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත හා සම්බන්ධ උපදේශන සේවා සැපයීම

2025 වර්ෂයේ මේ සම්බන්ධයෙන් දෛනිකව විධිමත් උපදේශන සේවා සැපයීම සිදු කරන ලදී. 2025.12.31 දින වන විට පුද්ගලයින් විශාල ප්‍රමාණයකට ලිඛිතව හා දුරකතනයෙන් විධිමත් උපදේශන ලබා දී ඇත. මෙහිදී පුරවැසියන්ට තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සම්බන්ධයෙන් උපදේශන සේවා සැපයීම මෙන්ම තොරතුරු අයිතිවාසිකම් පනත සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමට සහ පර්යේෂණ කිරීමට පැමිණෙන පුරවැසියන් දැනුම්වත් කිරීම සිදු වේ.

### 2.1.3. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නිල වෙබ් අඩවිය (www.rti.gov.lk) පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම

පුරවැසියන්ට ඵලදායී ලෙස තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත භාවිතයට ගැනීම මෙහි අරමුණයි. එමෙන්ම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පුරවැසියන්ගේ දැනුම්වත්භාවය වැඩිකිරීම හා තොරතුරු ඉල්ලීම් මගින් මහජන අවශ්‍යතා සැපයීමද අරමුණු වේ. මෙහිදී ඉදිරියේදී පැවත්වෙන වැඩසටහන් සම්බන්ධයෙන් වන ප්‍රචාරණය වැදගත් වෙයි. එමෙන්ම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම සම්බන්ධයෙන් ඉතා ක්‍රියාශීලී මෙන්ම වඩාත් ඵලදායී ලෙස භාවිතා කළ හැකි අයුරින් අමාත්‍යාංශ නිලධාරීන් යටතේ පවත්වාගෙන යන වෙබ් අඩවිය යාවත්කාලීන කරන ලදී.

**2.1.4. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ විද්‍යුත් තැපැල (rtiunitsl@gmail.com) පවත්වාගෙන යාම** පුරවැසියන්ට සහ පොදු අධිකාරීවල නිලධාරීන්ට ඇතිවන ගැටළු සඳහා පිළිතුරු අපේක්ෂාවෙන් යොමු කරන ලද විද්‍යුත් ලිපි සඳහා පිළිතුරු ලබා දීම සිදු කරනු ලැබේ.

**2.1.5. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ තොරතුරු නිලධාරී අත්පොත, පුහුණු මාර්ගෝපදේශය සහ අත්පත්‍රිකා බෙදාහැරීම**

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතට අදාළව පුහුණුකරුවන් පුහුණු කිරීමේ සහ රජයේ නිලධාරීන්, පුරවැසියන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් 23ක් දිවයින පුරා පවත්වන ලද අතර එම වැඩසටහන් සඳහා සහභාගී වූවන්හට නිලධාරී අත්පොත්, පුහුණු මාර්ගෝපදේශය හා අත්පත්‍රිකා 5479ක් බෙදා හරින ලදී. එම ප්‍රකාශන බෙදා හැරීම තුළින් ආයතනයන්හි තොරතුරු නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන කිරීම අපේක්ෂා කෙරේ.

**2.1.6. පොදු අධිකාරීන්හි නම්කළ නිලධාරීන් සහ තොරතුරු නිලධාරීන් සම්බන්ධ දත්ත පාදකය යාවත්කාලීන කිරීම**

පොදු අධිකාරීන්හි අලුතින් පත්කරන ලද තොරතුරු නිලධාරීන් සහ නම්කළ නිලධාරීන් සම්බන්ධයෙන් තොරතුරු යොමු කෙරෙන අතර එම නිලධාරීන් පිළිබඳ විස්තර ඇතුළත් දත්ත පද්ධතියක් (Data Base) වෙබ් අඩවියේ ඇතුළත් වන අතර එය මාසිකව යාවත්කාලීන කරනු ලැබේ.

**2.1.7. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සම්බන්ධයෙන් ෆේස්බුක් (face book ) පිටුවක් පවත්වාගෙන යාම සහ සමාජ මාධ්‍යවල ප්‍රචාරය කිරීම**

විශේෂයෙන්ම තරුණ ප්‍රජාව ඉලක්ක කොට ගනිමින් සහ පුරවැසියන් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පනත පිළිබඳ දැනුම්වත් කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරනු ලබන RTI Facebook පිටුව මඟින් ආකර්ෂණීය ලෙස දැනුම්වත් කිරීම සිදු වෙයි. 2025.12.31 දිනට සමස්ත පරිශීලකයන් සංඛ්‍යාව 3620ක් වේ. එමෙන්ම, තොරතුරු නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් සහ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් පැවත්වීමේදී ඒ සම්බන්ධව මුහුණු පොතේ එදිනම පළ කරනු ලැබේ.

**2.1.8. තොරතුරු දැනගැනීමේ පනත පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන්**

කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්කයන්හි තෝරාගත් පොදු අධිකාරීන්හි නිලධාරීන් සඳහා තොරතුරු පනත පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් 25ක් පවත්වන ලද අතර ඒ සඳහා සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව 2410කි.

**2.1.9. ජාත්‍යන්තර තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ දින සැමරුම - 2025**

2025 වර්ෂයට අදාළ ජාත්‍යන්තර තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ දින සැමරුම සැප්තැම්බර් මස 30 දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී ගරු සෞඛ්‍ය හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමියගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී. මෙම වැඩසටහන සඳහා සියලු අමාත්‍යාංශවල තොරතුරු නිලධාරීන් හා විෂය නිලධාරීන් 370ක් සහභාගී විය. 2025 වර්ෂයට අදාළ ජාත්‍යන්තර තොරතුරු දින සැමරුමට සමගාමීව කිලිනොච්චිය, මන්නාරම හා හම්බන්තොට යන දිස්ත්‍රික්කවල සහ නැගෙනහිර පළාතේ සිටින සියලුම පළාත් පාලන ආයතන සභිකයන් සඳහා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සම්බන්ධයෙන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

### 2.1.10. 'පවත' ප්‍රකාශයට පත්කිරීම

'පවත' පුවත්පත 2025.09.30 දින විශේෂ කලාපයක් ලෙස දිනමිණ හා තිනකරන් පුවත්පත් සමඟ සිංහල හා දෙමළ භාෂාවෙන් ලේක්හවුස් ආයතනය මඟින් ප්‍රකාශයට පත්කරන ලද අතර ඒ සමඟම අන්තර්ජාලයට ද මුදා හරින ලදී.

### 2.1.11 ජාතික මාධ්‍ය ප්‍රතිපත්තිය සකස් කිරීම

ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ ක්‍රමවත් මාර්ගෝපදේශකත්වයක් උදෙසා ජාතික මාධ්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශය කටයුතු ආරම්භ කළ අතර ඒ සඳහා රාජ්‍ය මාධ්‍ය ප්‍රධානීන්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්, නීතිඥයන්, විද්‍යුත් විකාශකයන්ගේ සංගමයේ නියෝජිතයන් සහ කර්තෘ සංසදයේ නියෝජිතයන්ගෙන් සමන්විත විද්වත් කමිටුවක් පත් කරන ලදී.
එම කමිටුව විසින් සියලු පාර්ශවකරුවන් ආවරණය වන අන්දමට යොමුගත කණ්ඩායම් සාකච්ඡා 07ක් පහත පරිදි පවත්වමින් ජාතික මාධ්‍ය ප්‍රතිපත්තියෙහි මූලික කෙටුම්පත සකස් කිරීමේ කටයුතු සිදුකරන ලදී.

i. අධ්‍යයන
ii. ජනමාධ්‍ය සංගම්
iii. අයිතිවාසිකම් පදනම් වූ සංවිධාන
iv. විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතන
v. උතුරු පළාත කේන්ද්‍ර කරගත් සාකච්ඡා
vi. නැගෙනහිර පළාත කේන්ද්‍ර කරගත් සාකච්ඡා
vii. පාසල් මාධ්‍ය සංගම්

මෙහිදී උතුරු හා නැගෙනහිර පළාත්වල මාධ්‍යවේදීන්ගේ හා මාධ්‍ය ක්ෂේත්‍රයට අදාළ සමාජ ක්‍රියාකරුවන්ගේ අදහස් ලබා ගැනීම ඉතා වැදගත් ලෙස සලකනු ලැබූ බැවින්, යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී සහ මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී යොමුගත කණ්ඩායම් සාකච්ඡා 02ක් පවත්වන ලද අතර එහිදී එම ප්‍රදේශවලට ආවේණික ගැටළු හඳුනාගැනීමටත්, නව අදහස් හා යෝජනා ලබා ගැනීමටත් හැකි විය.

මෙම විධිමත් ක්‍රමවේදයන් ඔස්සේ සියලු පාර්ශවකරුවන්ගෙන් ලබා ගන්නා ලද අදහස් හා යෝජනා වඩා විධිමත් සහ ප්‍රායෝගික ක්‍රමවේදයන් අනුගමනය කරමින් මාධ්‍ය ක්ෂේත්‍රය තුළ දැනට නිරීක්ෂණය වන පොදු දුර්වලතාවයන් මඟ හරවා ගනිමින් මාධ්‍ය ක්ෂේත්‍රය නව දිශානතියකට යොමු කිරීම අරමුණු කර ගනිමින් සකස් කරන ලද ජාතික මාධ්‍ය ප්‍රතිපත්තියෙහි මූලික කෙටුම්පත අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා 2024.03.28 දිනැතිව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

නව රජය යටතේ නැවතත් පොදු මහජන අදහස් ලබා ගැනීම සිදු කළ අතර ඒ අනුව විවිධ පාර්ශවකරුවන්ගෙන් ලබා ගන්නා ලද අදහස් හා යෝජනා අනුව ජාතික මාධ්‍ය ප්‍රතිපත්තියේ මූලික කෙටුම්පත මේ වන විට විද්වත් කමිටුව මඟින් සංශෝධනය කොට ඇත. ජාතික මාධ්‍ය ප්‍රතිපත්තියේ වැඩිදියුණු කරන ලද එම කෙටුම්පත (Advanced Draft) දෙමළ හා සිංහල භාෂාවන්ට පරිවර්තනය කිරීම සඳහා මේ වන විට යොමු කර ඇත.

### 2.1.12 රාජ්‍ය අනුග්‍රහය සහිතව ජනමාධ්‍ය උසස් අධ්‍යාපන ආයතනයක් පිහිටුවීම

ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ සේවයේ නියුතු මාධ්‍යවේදීන්ගේ වෘත්තීයභාවය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය (Chartered Institute of Media Professionals of Sri Lanka) යන මැයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට සමාන්තර ස්වාධීන ආයතනයක් මහා බ්‍රිතාන්‍යයේ දැනට ස්ථාපිත වරලත් ජනමාධ්‍ය ආයතනය පදනම් කරගනිමින් රාජ්‍ය අනුග්‍රහය සහිතව ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත. 2025.03.19 දින ගරු විෂයභාර අමාත්‍යතුමාගේ අත්සනින් යුත් 'ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය (Chartered Institute of Media Professionals – Sri Lanka) පිහිටුවීමේ පනත' යන මැයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් නව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා අමප/2/0588/815/043 අංක හා 2025.04.22 දිනැතිව අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී ඇත.

එම අමාත්‍ය මණ්ඩල තීරණය ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කරන ලද අතර 2025.05.20 දින Chartered Institute of Media Professionals of Sri Lanka Bill කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක විසින් කෙටුම්පත් කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති අතර එම කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක විසින් නීතිපතිගේ නිශ්කාෂණ සහතිකය ලබා ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත 2025.07.14 දින යොමු කර ඇත.

### 2.1.13 ජනාධිපති මාධ්‍ය සම්මාන උළෙල - 2025

මාධ්‍යවේදීන් විසින් ඉටු කරනු ලබන මෙහෙවර සහ ඔවුන්ගේ දායකත්වය අගය කිරීමත් ගුණාත්මක මාධ්‍ය සංස්කෘතියක් ඇති කිරීම සඳහාත් ජනාධිපති මාධ්‍ය සම්මාන උළෙලක් පැවැත්වීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ අනුව 2018 වර්ෂයට අදාළව ප්‍රථම වරට 2019 වර්ෂයේ දී ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් ජනාධිපති මාධ්‍ය සම්මාන උළෙල පවත්වා ඇත. නමුත් ඉන් පසුව වාර්ෂිකව ජනාධිපති මාධ්‍ය සම්මාන උළෙල සංවිධාන කටයුතු සිදු කළද ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් නොවීම,Covid - 19 වසංගතය හා පැවති ආර්ථික අර්බුදය හමුවේ මෙම උළෙල 2020, 2021 හා 2022 යන වර්ෂයන්හිදී පැවැත්වීමට නොහැකි වී ඇත.

2024 ජාතික අයවැයෙන් රුපියල් මිලියන 20ක ප්‍රතිපාදනයක් ජනාධිපති මාධ්‍ය සම්මාන උළෙල පැවැත්වීම සඳහා වෙන් විය. 2023 වර්ෂයට අදාළව නිර්මාණ අගයමින් 'ජනාධිපති මාධ්‍ය සම්මාන 2024' උළෙල පැවැත්වීම සඳහා එවකට ගරු ඇමතිතුමා වෙතින් 2024.10.01 දිනැතිව අනුමැතිය ලැබිණි. නමුත් ඇතිවූ අධිකාරීමය වෙනස්කම් මත ජනාධිපති මාධ්‍ය සම්මාන උලෙළ 2024 වර්ෂයේදී පැවැත්වීමට නොහැකි වීම හේතුවෙන් ජනාධිපති මාධ්‍ය සම්මාන උලෙළ 2025.11.11 දින පැවැත්වීය. 2025 අයවැය මඟින් ජනාධිපති මාධ්‍ය සම්මාන උළෙල සඳහා රුපියල් මිලියන 27.5ක ප්‍රතිපාදන වෙන් වී තිබුණි.

### 2.1.14 ප්‍රවෘත්ති වෙබ් අඩවි ලියාපදිංචි කිරීම

අංක 12/1037/37/019-1 සහ 2012.08.13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ප්‍රවෘත්ති වෙබ් අඩවි ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කරනු ලැබේ. සෑම වෙබ් අඩවියක්ම ලියාපදිංචි කිරීම සඳහා රුපියල් 25,000ක් ද ලියාපදිංචිය වාර්ෂිකව අලුත් කිරීම සඳහා රුපියල් 10,000ක් ද අය කරනු ලැබේ. 2025.12.31 දිනට අමාත්‍යාංශය යටතේ ප්‍රවෘත්ති වෙබ් අඩවි 17ක් ලියාපදිංචි කර ඇති අතර වෙබ් අඩවි 39ක් ලියාපදිංචිය අලුත් කර ඇත. මෙම ක්‍රියාවලිය වර්ෂය පුරාවටම ක්‍රියාත්මක වේ.

### 2.1.15 රූපවාහිනී හා ගුවන්විදුලි බලපත්‍ර නිකුත් කිරීම

ශ්‍රී ලංකාව තුළ ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශන විෂයයන්ට බලපාන මූලික ව්‍යවස්ථාවන් වනුයේ 1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා පනත සහ 1982 අංක 06 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතය. යථෝක්ත පනත්වල සඳහන් ව්‍යවස්ථා ප්‍රතිපාදන අනුව පෞද්ගලික ගුවන්විදුලි සහ රූපවාහිනි විකාශන සේවාවන් පවත්වාගෙන යාම සඳහා මෙම අමාත්‍යාංශය මඟින් බලපත්‍ර ලබා දීම සිදු කර ඇත.

විකාශන බලපත්‍රයන්හි ඒකමතිකභාවයක් ඇති කිරීම සඳහා  පොදු ආකෘතියක් හඳුන්වාදීමට කටයුතු සිදු කරන ලද අතර, සකස් කරන ලද පොදු ආකෘති පත්‍රය නීතිපති අනුමැතිය ලබාගැනීම සඳහා ඉදිරිපත් කර ඇත.

තවද, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ගුවන්විදුලි වර්ණාවලියේ උපරිම ධාරිතාවේ සීමාව ඉක්මවා ඇති බැවින් මෙම අමාත්‍යාංශය මඟින් ගුවන්විදුලි නාලිකා සඳහා බලපත්‍ර නිකුත් කිරීමක් දැනට සිදු නොකෙරේ.

එසේම, ශ්‍රී ලංකාව තුල ඩිජිටල් භෞමික රූපවාහිනී විකාශන (DTTB) ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන බැවින්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව යටතේ රූපවාහිනී නාලිකා භෞමිකව ක්‍රියාත්මක කිරීම සඳහා සංඛ්‍යාත වර්ණාවලියෙන් සංඛ්‍යාත වෙන් කිරීමේ ක්‍රියාවලිය 2025.11.01 දින සිට අත්හිටුවීමටත්, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් 2025.11.01 දින සිට බලපැවැත්වෙන පරිදි රූපවාහිනී නාලිකා භෞමිකව ක්‍රියාත්මක කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය අත්හිටුවීමටත් මෙම අමාත්‍යාංශය හා ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය විසින් එක්ව ඉදිරිපත් කරන ලද අංක. MMI/AD2/16/2025/1-XLIV හා 2025.10.20 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අංක අමප/25/2167/815/147 හා 2025.12.02 දිනැතිව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ අනුව මෙම අමාත්‍යාංශය මඟින් රූපවාහිනී විකාශන බලපත්‍ර නිකුත් නොකෙරේ.

**2025 දෙසැම්බර් 31 දින වන විට ක්‍රියාකාරීව පවතින පෞද්ගලික ගුවන්විදුලි හා රූපවාහිනී බලපත්‍ර සංඛ්‍යාව හා නාලිකා සංඛ්‍යාව**

| බලපත්‍ර වර්ගීකරණය | පෞද්ගලික බලපත්‍රලාභී ආයතන සංඛ්‍යාව | නාලිකා සංඛ්‍යාව |
|---|---|---|
| ගුවන්විදුලි | 18 | 51 |
| භෞමික රූපවාහිනී | 16 | 23 |
| **එකතුව** | **34** | **74** |

**සේවා සපයන ආයතන**

| බලපත්‍ර වර්ගීකරණය | බලපත්‍රලාභී ආයතන සංඛ්‍යාව |
|---|---|
| කේබල් රූපවාහිනී | 06 |
| චන්ද්‍රිකා රූපවාහිනී | 03 |
| අන්තර්ජාල මත පදනම් වූ රූපවාහිනී | 03 |
| **එකතුව** | **12** |

තවද රාජ්‍ය ගුවන්විදුලි ආයතන දෙක වන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව හා සී/ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය ඔස්සේ ප්‍රාදේශීය සේවාවන්ද ඇතුළුව ගුවන්විදුලි නාලිකා 15ක් පවත්වාගෙන යනු ලබන අතර ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව හා සී/ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය යන ආයතන දෙක ඔස්සේ රූපවාහිනී සේවාවන් 05ක් පවත්වාගෙන යනු ලැබේ. භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස උපරිමයෙන් ආරක්ෂා කරමින් වඩා යහපත් මාධ්‍යකරණයක් සඳහා දැනට නිකුත්කර ඇති ගුවන්විදුලි හා රූපවාහිනී විකාශන බලපත්‍රයන්හි ඒකමතිකභාවයක් ඇති කිරීමේ අරමුණින් පොදු ආකෘතියක් හඳුන්වාදීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී ඇත. ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් කමිටුවක් පත්කර, නිකුත් කර ඇති ගුවන්විදුලි හා රූපවාහිනී විකාශන බලපත්‍ර සමාලෝචනය සිදු කර සකස් කරන ලද පොදු ආකෘති පත්‍රය නීතිපති උපදෙස් ලබා ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

### 2.1.16 කාන්තාවන් සහ ජනවාර්ගික - ආගමික සුළුතරයන්ගේ ගරුත්වය සුරැකීම කෙරෙහි අවධානය යොමු කරමින් මාධ්‍යවේදීන් සඳහා අචාරධර්ම සංග්‍රහයක් හඳුන්වාදීම

'කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2023 – 2027' යටතේ කාන්තාව සහ ජනවාර්ගික - ආගමික සුළුතරයන්ගේ ගරුත්වය සුරැකීම කෙරෙහි අවධානය යොමු කරමින් මාධ්‍යවේදීන් සඳහා අචාරධර්ම සංග්‍රහයක් හඳුන්වාදීම මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇත. ඒ සඳහා විද්වත් කමිටුවක් පත් කර ඇති අතර, කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලිය කමිටුව මඟින් සිදු කර අවසන් වීමෙන් පසුව පාර්ශවකරුවන්ගේ අදහස් ලබා ගැනීමට නියමිතය.

### 2.1.17 'ඇසිදිසි' ජනමාධ්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන

විසිඑක් වන සියවසේ අභියෝගයන්ට සාර්ථකව මුහුණදෙනු වස් ජනමාධ්‍යවේදීන් දැනුමෙන්, කුසලතාවයෙන් හා ආකල්පමය වශයෙන් සන්නද්ධ කරමින් වෘත්තීය ජනමාධ්‍ය කලාවක් ස්ථාපිත කිරීම උදෙසා පුහුණු පාඨමාලා මඟින් තම වෘත්තීය කුසලතා වර්ධනය කර ගැනීමට ඉඩ ප්‍රස්ථා සලසාදීම "ඇසිදිසි ජනමාධ්‍ය ශිෂ්‍යත්ව" වැඩසටහනේ මූලික අරමුණයි.

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ, ජනමාධ්‍ය අංශය මඟින් වාර්ෂිකව මෙම ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබේ.

දිවයිනේ පිළිගත් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතනවල වසර 03ක සේවා කාලයක් සපුරා ඇති පූර්ණකාලීන හෝ අර්ධ කාලීන පදනම මත සේවයේ නියැළී සිටින, වයස අවුරුදු 18-55 අතර මාධ්‍යවේදීන්, නිදහස් මාධ්‍යවේදීන්, ප්‍රාදේශීය මාධ්‍යවේදීන්, වෙබ් මාධ්‍යවේදීන් සහ මාධ්‍ය තාක්ෂණික ශිල්පීන්ට ආපසු නොගෙවන පදනම යටතේ මෙම ශිෂ්‍යත්ව පිරිනමනු ලැබේ. මේ සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් ජනමාධ්‍යවේදීන් සඳහා නිකුත් කරන මාධ්‍යවේදී හැඳුනුම්පත ලබා තිබිය යුතු වේ.

උපාධි, පශ්චාද් උපාධි පාඨමාලා සඳහා රුපියල් ලක්ෂ දෙකක (200,000.00) උපරිමයකට යටත්ව හා කෙටි කාලීන හෝ දිගු කාලීන සහතික පත්‍ර පාඨමාලා, ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා පාඨමාලා සඳහා රුපියල් ලක්ෂයක (100,000.00) උපරිමයකට යටත්වද මෙම ශිෂ්‍යත්ව මුදල් ලබාදේ. මේ යටතේ ශිෂ්‍යත්වලාභීන්ට පිළිගත් විශ්වවිද්‍යාල, උසස් අධ්‍යාපනික පුහුණු ආයතන මඟින් පවත්වනු ලබන මාධ්‍ය ක්ෂේත්‍රයට අදාළ පාඨමාලා හැදෑරිය හැකිය.

ශිෂ්‍යත්වලාභියාගෙන් කිසිදු මුදලක් අය නොකර රජය විසින් ලබාදෙන මෙම ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය යටතේ මාධ්‍යවේදීන්ට දෙවරක් ප්‍රතිලාභ ලබාගැනීමට අවස්ථාව සැලසෙන අතර, පළමු අවස්ථාවේ පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කළ ජනමාධ්‍යවේදීන්ට වසර 05ක් ඉක්මගිය පසු දෙවන අවස්ථාව සඳහා අයදුම් කළ හැකිය.

ශිෂ්‍යත්වය සඳහා හිමිකම් ලබන මාධ්‍යවේදීන්ට පාඨමාලාව සඳහා වන ගාස්තුවෙන් 50% ක් පාඨමාලාව ආරම්භයේදී පළමු වාරිකය ලෙසද 25% ක් පාඨමාලාවේ දෙවෙනි වාරිකය ලෙසද ඉතිරි 25% පාඨමාලාව සම්පූර්ණ කර සහතික පත්‍රය ඉදිරිපත් කිරීමෙන් අනතුරුවද ගෙවීම සිදු කරයි.

2025 වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 07ක් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ලබාදී ඇත. මෙම වසරේ මූලික සුදුසුකම් සපුරා ඇති සියලුම අයදුම්කරුවන් සඳහා ශිෂ්‍යත්ව ලබා දීමට හැකි විය. ඒ අනුව ලේකම්තුමා විසින් පත්කරන තේරීම් කමිටුව මඟින් තෝරාපත් කරගත් මූලික සුදුසුකම් ඇති මාධ්‍යවේදීන් 61 දෙනෙකු ශිෂ්‍යත්ව හිමිකරගෙන ඇත.

### 2.1.18 ආනයනය කරන ලද ටෙලි නාට්‍ය, චිත්‍රපට හා වාණිජ බද්ද වැඩසටහන් සඳහා බදු අයකිරීම

මෙම අමාත්‍යාංශය මඟින් 2016 අංක 11 දරන මුදල් පනත මඟින් පනවා ඇති නියෝගයන්ට අනුව රූපවාහිනී නාලිකා මඟින් විකාශනය කරනු ලබන ආනයනික වැඩසටහන් සඳහා බදු අය කෙරේ.

2025 දෙසැම්බර් 31 දින දක්වා ආනයනික ටෙලි නාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩසටහන් 1363 ක් සඳහා නිශ්කාෂණ සහතිකපත් නිකුත් කර ඇති අතර අයකර ගනු ලැබූ බදු මුදල රු.මි. 94.15 කි. එය ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදී. මෙම කාර්යය සඳහා සමීක්ෂණ මණ්ඩල සාමාජිකයන් 30 දෙනෙකු සම්බන්ධ කර ඇති අතර දෛනිකව තිදෙනා බැගින් වන අනු කමිටු වාර 355 ක් මඟින් විකාශන අනුමැතීන් ලබාදී ඇත.

**2025 දෙසැම්බර් 31 දින දක්වා බදු අයකරනු ලැබූ හා බද්දෙන් නිදහස් කරනු ලැබූ වැඩසටහන්**

| වැඩසටහන් වර්ගය | බද්දෙන් නිදහස් කරනු ලැබූ වැඩසටහන් සංඛ්‍යාව | බදු අයකරනු ලැබූ වැඩසටහන් සංඛ්‍යාව | බදු ආදායම (රු.මි.) |
|---|---|---|---|
| චිත්‍රපට | 1339 | 2 | 0.9 |
| ටෙලි නාට්‍ය හා වාර්තා වැඩසටහන් | 24 | 465 | 67.75 |
| වෙළඳ දැන්වීම් හා වෙළඳ වැඩසටහන් | - | 84 | 25.5 |
| **එකතුව** | **1363** | **551** | **94.15** |

**2.1.19 ජනමාධ්‍ය විෂය පථයට අයත් අනුබද්ධිත ආයතනයන්හි පනත් කාලීනව සංශෝධනය කිරීම**

ජනමාධ්‍ය විෂය පථයට අයත් වන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, සී/ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය, සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (ලේක්හවුස්), ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය හා ශ්‍රී ලංකා පදනම් ආයතනය යන ආයතන නීත්‍යානුකූලව පිහිටුවා ඇති පනත් හා සාංගමික ව්‍යවස්ථාවලි මීට වසර 40කට පමණ පෙර එවකට පැවති ආර්ථික, සාමාජීය හා සංස්කෘතික අවශ්‍යතාවයන්ට ගැලපෙන ලෙස සකස් කර ඇති අතර මෑත කාලයේදී කිසිදු සමාලෝචනයකට ලක් කර නොමැත. එසේම තැපැල් දෙපාර්තමේන්තුව, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වැනි රාජ්‍ය ආයතන තමන්ගේ දෛනික රාජකාරිවලදී භාවිතා කරන අණ පනත්ද මීට දශක 05 කට පමණ පෙර සම්මත කර ඇති අණ පනත් වේ. කාලීන අවශ්‍යතාවයන්ට අනුගත වෙමින් පෞද්ගලික මාධ්‍ය හා සමාන කාර්යය හා සේවාවන් කරනු ලබන පෞද්ගලික ආයතන තරඟකාරී ලෙස ඉදිරියට පැමිණ ඇතිමුත් යල් පැනගිය පනත් හා නීතිරීති තුළ සිරවී සිටීමට සිදුවීම හේතුවෙන් රාජ්‍ය මාධ්‍ය හා රාජ්‍ය ආයතනවල ඉදිරි ගමන මන්දගාමී වී ඇත.

එසේම, ඩිජිටල් තාක්ෂණය සමඟ මතුවිය හැකි ඉදිරි ගැටළු සඳහා අනාගතයට ගැලපෙන ලෙස මෙම අමාත්‍යාංශ විෂය පථයට අයත්ව ඇති අණ පනත් සංශෝධනය විය යුතුව ඇති අතර ශීඝ්‍රයෙන් වෙනස් වන තාක්ෂණික හා සමාජ රුචිකත්වයට ගැලපෙන ලෙස කටයුතු කරමින් මාධ්‍ය ක්ෂේත්‍රයේ පවත්නා දැඩි තරඟකාරීත්වයට සාර්ථකව මුහුණ දී එය ජයගැනීමට හැකියාව ලැබෙන ලෙසත් ස්වාධීනව නැඟී සිටීමට අවශ්‍ය වන ආයතනික ව්‍යුහයන් සකස් කරගැනීමට අවකාශ සැලසීමටත් දැනට පවත්නා අණ පනත් සංශෝධනය කිරීම ආරම්භ කර ඇත.

**ජනමාධ්‍ය විෂය පථයට අයත් අනුබද්ධිත ආයතනයන්හි පනත් කාලීනව සංශෝධනය කිරීමේ කාර්යයෙහි ප්‍රගතිය**

**(අ) 1973 අංක 31 දරන ශ්‍රී ලංකා පදනම් පනත සංශෝධනය කිරීම**

අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව පනත සංශෝධනය සඳහා 2024.04.01 දින නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත. ඒ අනුව සංශෝධිත මූලික කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක විසින් 2024.09.18 දින අමාත්‍යාංශයට යොමු කරමින් ඉදිරි කටයුතු සඳහා වර්තමාන අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියක් අවශ්‍ය බව දන්වා ඇත. මේ සම්බන්ධව ශ්‍රී ලංකා පදනම් ආයතනයේ වත්මන් පාලක මණ්ඩලයද දැනුම්වත් කර ඇත.

කෙසේ වුවත්, 'රජයට අයත් වාණිජමය නොවන ආයතන සමාලෝචනය පිළිබඳ අමප අංක 25/0288/802/005 පිළිබඳව වූ 2025.03.17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීම - 2025 ජූනි මස 30 දිනට ප්‍රගතිය' යන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලද අග්‍රාමාත්‍ය කමිටුව මඟින් යොමු කර ඇති අමප/25/1371/802/005-III හා 2025.08.19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි මෙම ආයතනයේ ව්‍යුහය සම්බන්ධව අධ්‍යයනය කරමින් පවතී.

**(ආ) 1973 අංක 05 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීම**

1973 අංක 05 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත වර්තමාන සමාජ හා සංස්කෘතික ප්‍රවණතා පිළිබිඹු වන පරිදි යාවත්කාලීන වී නොමැත. වර්තමානයේ සන්නිවේදන තාක්ෂණයේ දියුණුවත් සමඟ පුවත්පත් හා ගුවන්විදුලියට අමතරව රූපවාහිනිය, අන්තර්ජාලය සහ සමාජ මාධ්‍ය ජාල ඉතා වේගයෙන් ජනතාව අතර ව්‍යාප්ත වී ඇති අතර එමඟින් ජන ජීවිතය වෙත ප්‍රබල බලපෑම් එල්ල වී ඇත. ඒ අනුව යම් පුවත්පත් වාර්තාවක් යම් විද්‍යුත් මාධ්‍යයක් මඟින් විකාශනය හා ප්‍රචාරය කිරීමෙන් පසු එම වාර්තාව සම්බන්ධව පුවත්පත් මණ්ඩලය මඟින් විභාගයක් පැවැත් වූ අවස්ථාවේදී එම විභාගයේ ප්‍රතිඵලයක් වශයෙන් තීරණය කරන ලද නිවැරදි කිරීම/ එකඟතාව/ නියෝගයද මුල් වාර්තා විකාශය හා ප්‍රචාරය කරන ලද විද්‍යුත් මාධ්‍ය විසින් විකාශය හා ප්‍රචාරය කළ යුතු වීම සහ මුද්‍රිත පුවත්පත්වල/ සඟරාවල විද්‍යුත් ප්‍රකාශනයන් හෝ මුද්‍රිත පුවත්පත් ස්වරූපයෙන් පළ කරනු ලබන විද්‍යුත් පුවත්පත් හෝ සඟරා ලියාපදිංචි කිරීම සහ ඒවා සම්බන්ධයෙන් පැමිණිලි විභාග කිරීම යන ප්‍රධාන කරුණු සම්බන්ධයෙන් විධිවිධාන ඇතුළත් කරමින් 1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව සඳහා 2025.09.08 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. අමාත්‍ය මණ්ඩල තීරණයෙහි පිටපතක් 2025.10.08 වන දින නීති කෙටුම්පත් සම්පාදක වෙත අවශ්‍ය කටයුතු සඳහා යොමු කර ඇත.

**(ඈ) තැපැල් දෙපාර්තමේන්තු පනත් සංශෝධනය කිරීම**

- **1989 අංක 09, 1943 අංක 23, 1952 අංක 56, 1958 අංක 46 දරන පනත් මඟින් සංශෝධිත 1931 අංක 01 දරන තැපැල් කාර්යාල ඇප අරමුදල ආඥා පනත - 473 අධිකාරය සංශෝධනය කිරීම**

මෙම පනත් සංශෝධනයන් සිදුකිරීමට අදාළව ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධව දෙපාර්තමේන්තුව විසින් මේ වනතෙක් ඔවුන්ගේ නිරීක්ෂණ හා නිර්දේශ ලබාදී නොමැති බැවින්, එම දෙපාර්තමේන්තුව විසින් ඒ සඳහා නිරීක්ෂණ නිර්දේශ ලබාදුන් පසු එහි ඉදිරි පියවර ගැනීමට අපේක්ෂා කෙරේ.

- **1955 අංක 31, 1957 අංක 24 දරන පනත මඟින් සහ 1973 අංක 06 දරන නීතියෙන් සංශෝධිත 1908 අංක 11 දරන තැපැල් කාර්යාල ආඥා පනත - 190 අධිකාරය සංශෝධනය කිරීම**

මෙම පනත් සංශෝධනයන් සිදුකිරීමට අදාළව ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධව දෙපාර්තමේන්තුව විසින් මේ වනතෙක් ඔවුන්ගේ නිරීක්ෂණ හා නිර්දේශ ලබාදී නොමැති බැවින්, එම දෙපාර්තමේන්තුව විසින් ඒ සඳහා නිරීක්ෂණ නිර්දේශ ලබාදුන් පසු එහි ඉදිරි පියවර ගැනීමට අපේක්ෂා කෙරේ.

**(ඇ) ශ්‍රී ලංකා වරලත් ජනමාධ්‍යවේදී ආයතනය - Chartered Institute of Media Professionals – Sri Lanka යන නමින් ජනමාධ්‍ය වෘත්තීමය ආයතනයක් පිහිටුවීමේ පනත් කෙටුම්පත සැකසීම**

ඉහළ වෘත්තීය නිපුණතා සහිත මාධ්‍ය වෘත්තිකයන් බිහිකිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව වෘත්තීමය ආයතනයක් පිහිටුවීම සඳහා 2025.03.19 වන දින ගරු විෂයභාර අමාත්‍යතුමාගේ අත්සනින් යුත් 'ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය (Chartered Institute of Media Professionals – Sri Lanka) පිහිටුවීමේ පනත' යන මැයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් නව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා 2025.04.07 දින අමප/2/0588/815/043 අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී ඇත.

ඒ අනුව, ඉහත අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කෙටුම්පත් කිරීමේ ඉදිරි කටයුතු සිදුකරන ලෙස 2025.04.30 වන දින අප අමාත්‍යාංශය විසින් නීති කෙටුම්පත් සම්පාදක වෙත දැනුම් දෙන ලදී. නීතිපති දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණද ලබා ගනිමින් කෙටුම්පත් කාර්යය නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී. නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් මත අවසාන පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් 2025.12.31 වන දින නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

**(ඉ) විද්‍යුත් විකාශන නියාමන කොමිෂන් සභා පනත (Establishment of the Broadcasting Regulatory Commission Act)**

භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස උපරිමයෙන් සුරක්ෂිත කරමින් ප්‍රශස්ත මාධ්‍යකරණයක් තහවුරු කිරීමේ අරමුණින් විද්‍යුත් මාධ්‍ය සඳහා 'විද්‍යුත් විකාශන නියාමන කොමිෂන් සභා පනතක් හඳුන්වාදීම' සඳහා කෙටුම්පත් කරන ලද පනත සඳහා 2023.11.28 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

ඒ අනුව අවසන් කෙටුම්පත සකස් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමුකර ඇත. ඒ අනුව සකස් කරන ලද මූලික කෙටුම්පත නිරීක්ෂණ සඳහා නීතිපති වෙත යොමුකර ඇති අතර නීතිපතිගේ නිරීක්ෂණ 2024.11.01 දින නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමුකර ඇත.

කෙසේ නමුත්, වර්තමාන රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය වන 'පොහොසත් රටක් ලස්සන ජීවිතයක්' හි ජනමාධ්‍ය අංශයට අදාළව 'නිදහස් ජනමාධ්‍ය කර්මාන්තයක් - සමබර තොරතුරු සමාජයක්' හි අන්තර්ගතව තිබෙන ක්‍රියාකාරකම් සම්බන්ධව 2025-2029 කාල පරිච්ඡේදය තුළ සම්පූර්ණ වන ආකාරයට ක්‍රියාත්මක සැලසුමෙහි සඳහන් එක් කරුණක් වනුයේ සමස්ත ජනමාධ්‍ය ක්‍රියාවලිය ප්‍රශස්ත ලෙස පවත්වාගෙන යාම සඳහා ස්වාධීන ජනමාධ්‍ය කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීම යි. ඒ අනුව, මේ පිළිබඳව ගරු විෂයභාර අමාත්‍යවරයාගෙන් මේ වන තෙක් අනුමැතිය ලැබී නොමැත.අවශ්‍ය අනුමැතිය ලද පසු එහි ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම අපේක්ෂාව වේ.

## 2.1.20 ශ්‍රී ලංකාවේ භෞමික රූපවාහිනී විකාශනය අංකිත කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

භෞමික රූපවාහිනි විකාශනය ප්‍රතිසම (Analog) ක්‍රමවේදයේ සිට අංකිත (Digital) ක්‍රමවේදය දක්වා ගමන් කරන ගෝලීය ප්‍රවණතාවයට ශ්‍රී ලංකාව ද අනුගත විය යුතුය. වර්තමානයේ පවත්නා තාක්ෂණය ක්‍රමයෙන් යල්පැන ගිය තත්ත්වයට පත්ව විකාශන පද්ධතිය නඩත්තු කිරීම හා අතිරේක රූපවාහිනී නාලිකා අවශ්‍යතාව සපුරාලීමේ අභියෝගයන්ට මුහුණ පෑමට සිදුව ඇත. ඉතාම කාර්යක්ෂම අංකිත (Digital) තාක්ෂණය පවතිද්දී තවදුරටත් ප්‍රතිසම (Analog) තාක්ෂණය භාවිතයෙන් සංඛ්‍යාත පරාසය (frequency spectrum) අපතේ යාමක් සිදුවන අතර එම සංඛ්‍යාත පරාසය අනෙකුත් විදුලි සංදේශ සේවාවන්ට යොදා ගැනීමට ඇති හැකියාව මඟ හැරී යනු ඇත.

බොහෝ රටවල් අංකිත තාක්ෂණය වෙත අවතීර්ණ වන බැවින් ප්‍රතිසම (Analog) උපාංග (Transmitter) විදේශීය වෙළඳපොළ තුළ නිෂ්පාදනය නොවේ. එබැවින් අදාළ සන්නිවේදන උපකරණ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි විශාල පිරිවැයක් දරා නිෂ්පාදන ආයතන වෙතින් නිෂ්පාදනය කර ගත යුතුය. එමෙන්ම මෙම උපාංගවල නඩත්තු කටයුතු සහ වැඩිදියුණු කිරීම් සඳහා දල නව උපාංග මිළදී ගැනීමේදි විදේශ විනිමය විශාල ප්‍රමාණයක් වැය කිරීමට සිදුවන අතර එය සියලුම මාධ්‍ය ආයතන මෙන්ම රජය ද මුහුණ දෙන විශාල අභියෝගයකි. තවද, මෙම සන්නිවේදන උපකරණවල විදුලි පිරිවැය ඉතා ඉහළ බැවින් තවදුරටත් මෙම සේවය මෙලෙසින්ම පවත්වාගෙන යාම සේවා ආයතනවල මෙහෙයුම් පිරිවැය ඉහළ යාමට හේතු වේ.

එමෙන්ම, ගාස්තු අයකර රූපවාහිනි සේවාවන් ලබා දෙන ආයතන තිබුණද, එම රූපවාහිනි ආයතනවල ගෙවීම් ස්වභාවය මත බහුතර පවුල් ඒකක ප්‍රමාණයක් තවමත් ප්‍රතිසම සේවාවන් තුළම රැඳී සිටී.

2009 වර්ෂයේදී DVB - T තාක්ෂණය හා 2010 වසරේදී DVB - T2 තාක්ෂණය යටතේ දැනට පවත්නා ප්‍රතිසම (Analog) භෞමික රූපවාහිනි විකාශනය අංකිත (Digital) භෞමික රූපවාහිනි විකාශනය දක්වා පරිවර්තනය කිරීම ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය මෙන්ම විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින්ද , විවිධ ක්‍රියාමාර්ග සහ සාධනීය පියවර කිහිපයක් ගෙන තිබුණ ද, ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන නොවූ බැවින්, එය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. 2009 වසරේ පළමු අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කළ දින සිට අංකිතකරණ (Digitalization) ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ මූලිකත්වය ගෙන ක්‍රියා කරන ලද්දේ ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය වන අතර, තාක්ෂණික ප්‍රමිතීන් ස්ථාපිත කරමින් අංකිතකරණ ක්‍රියාවලිය

ක්‍රියාත්මක කිරීම සඳහා වන අංකිතකරණ විකාශන සැලැස්ම (Digital Broadcasting Road Map) සකස් කිරීම සඳහා පූර්ණ සහයෝගය ලබාදෙන ලද්දේ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසිනි.

ඒ අතරතුර ජපාන, JICA ආයතනය යටතේ කරන ලද ශක්‍යතා අධ්‍යනයකින් අනතුරුව, ශ්‍රී ලංකාවට ගැලපෙන ලෙස ජපාන ISDB - T තාක්ෂණය සකස් කිරීම පිණිස යෝජනා විය. ඒ අනුව 2014 වසරේ DVB - T2 තාක්ෂණය වෙනුවට ISDB - T තාක්ෂණය යොදා ගැනීමට එකඟ විය. ඒ අනුව ඩිජිටල්කරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස 2014 සැප්තැම්බර් මස 23 වන දින ශ්‍රී ලංකා රජය විසින් ජපාන සහන ණය ගිවිසුමකට (Soft Loan Agreement) අවතීර්ණය වෙමින් 2014 ඔක්තෝම්බර් මාසයේදී, ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය විසින් එහි කටයුතු ආරම්භ කරන ලදී.

2021 වසරේ දෙසැම්බර් මස අවසන් වීමට නියමිතව තිබූ මෙම ව්‍යාපෘතිය සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක නොවූ බැවින් එවකට ජනාධිපතිතුමා තාක්ෂණ අමාත්‍යවරයා ලෙස හා ගරු ජනමාධ්‍ය අමාත්‍යතුමා ඒකාබද්ධව යොමු කළ 'ජපාන ණය ආධාර යටතේ ශ්‍රී ලංකාවේ භෞමික රූපවාහිනී විකශනය අංකිත කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම (SL P112)' යන මැයෙන් වූ 2021 අප්‍රේල් 01 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අමප/21/0621/316/016 හා 2021.04.28 දිනැති අමාත්‍ය මණ්ඩලය එළැඹි තීරණය මගින් මෙම ව්‍යාපෘතිය යාවත්කාලීන කරන ලද තාක්ෂණය සමග ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමි විය.

අංකිත (Digital) තාක්ෂණයට අනුගත වීම මගින් රජයට අත්වන විශාලතම ප්‍රතිලාභය වන්නේ වර්තමානයේ භාවිත වන සංඛ්‍යාත පරාසයෙන් (Frequency Spectrum) වැඩි ප්‍රමාණයක් මුදා හැරීමට ඇති හැකියාවයි. එබැවින් එම සංඛ්‍යාත පරාසය 5G නිරූහැන් පුළුල් පරාස (Broadband) සේවා සඳහා භාවිත කිරීමට හැකිවන අතර, මෙමගින් නවීනතම තාක්ෂණය ග්‍රාමීය ප්‍රදේශවලට ගෙනයාම පහසු වනු ඇත. තවද, අනාගතයේදී රූපවාහිනී නාලිකා ප්‍රමාණය වැඩි කර ගැනීමට ද හැකියාව ලැබේ.

සියලු විකාශන මෙහෙයුම්කරුවන් විසින් පවත්වාගෙන යනු ලබන තනි විකාශන ජාල වෙනුවට, අංකිත (Digital) විකාශන ජාල මෙහෙයුම්කරු (Digital Broadcast Network Operator – DBNO) ලෙස තනි මෙයෙවන්නෙකු ස්ථාපිතවීම රූපවාහිනී විකාශකයා ලබන වාසියකි.

එමෙන්ම යල්පිනු ප්‍රතිසම තාක්ෂණය භාවිත කරනු ලබන විකාශනාගාර නඩත්තුව සඳහා විශාල මුදලක් වාර්ෂිකව වැය කිරීමට විකාශන ආයතනවලට සිදු වන අතර, ව්‍යාපෘතිය අවසන් වූ පසු ඔවුන්ට තනි තනිව විකාශන ජාල නඩත්තු කිරීමට අවශ්‍ය නොවන අතර, මෙමඟින් නඩත්තු පිරිවැය ද විශාල ලෙස අඩුවනු ඇත.

ප්‍රතිසම (Analog) ක්‍රමවේදයේ අත්විඳිනු ලබන දුර්වල සංඥා ලැබීම් වෙනුවට ඉතා උසස් අංකිත (Digital) රූප රාමු නැරඹීමට ඇති හැකියාව, තනි තනි රූපවාහිනී නාලිකා වෙනුවට සියලු රූපවාහිනී නාලිකා සඳහා එක් ඇන්ටනාවක් නිවසෙහි ස්ථාපිත කිරීම ප්‍රමාණවත් වීම, සියලු දේශීය නාලිකා එක සමාන තත්ත්වයෙන් රසවින්දනය කිරීමේ හැකියාව සහ කිසිදු ගෙවීමකින් තොරව අධි විස්තෘත (High Definition – HD) රූපවාහිනී නැරඹීමේ අත්දැකීම ලැබීම ප්‍රේක්ෂකයා වෙත ලැබෙන ප්‍රධාන ප්‍රතිලාභ වේ.

රූපවාහිනී විකාශන ඩිජිටල්කරණ වේදිකාවට අදාළ (DTTB Platform) සියළු මෙහෙයුම් කටයුතු (NOC Operations) හා කොළඹ ඇතුළු බස්නාහිර පළාත තුළ විකාශන කටයුතු කොළඹ නෙළුම් කුළුණ කේන්ද්‍රකොට ගෙන සිදු කිරීමට නියමිතය.

මෙම ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය ජපන් යෙන් මිලියන 17,717 කි. (JICA ආයතනයේ දායකත්වයේ වටිනාකම ජපන් යෙන් මිලියන 13,717 ක් ද . රජයේ දායකත්වය ජපන් යෙන් මිලියන 3,505 ක් ද වශයෙනි)

ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ස්ථාපිත කර, 2021.07.15 දින මෙම ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කටයුතු ආරම්භ කරන ලදි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ඉංජිනේරු උපදේශන සේවා ලබා ගැනීමට JICA ආයතනයේ එකඟතාව මත ජපන් උපදේශන සේවා ආයතනයක් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද උපදේශන ප්‍රසම්පාදන කමිටුවක් (CPCC) විසින් තෝරා ගෙන ඇත. ඒ අනුව 2022.08.08 දින අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව එවකට රටේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් JICA ආයතනය සියලුම ජපන් ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලබා දීම තාවකාලිකව නවතා තිබු හෙයින් එය නැවත ආරම්භ කල පසු ඉංජිනේරු උපදේශන සේවා සැපයීමේ කොන්ත්‍රාත්තුව පිරිනැමීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි ව ඇත.

ඒ අනුව 2024 ජුලි අගභාගයේදී JICA ආයතනය විසින් තාවකාලික ප්‍රතිපාදන අත්හිටුවීම ඉවත් කරන ලද අතර 2024 සැප්තැම්බර් මස නව රජය බලයට පත් වු පසු ව්‍යාපෘතිය පිළිබඳව පුළුල් අධ්‍යනයක් කර ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබිණි.

**2025 දෙසැම්බර් 31 දක්වා ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය**

- සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය සහ ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය එක්ව ඉදිරිපත් කරන ලද කැබිනට් මණ්ඩල පත්‍රිකාව මත මෙම ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු ආරම්භ කිරීමට 2025.01.09 දින කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදි. එම ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු තීරණය කිරීම සඳහා අදාල කැබිනට් තීරණය ප්‍රකාරව කමිටුවක් පත් කරන ලද අතර එම කමිටුවේ පළමු රැස්වීම 2025.01.20 දින පැවැත්විණි.

- අනතුරුව, 2025.02.24 වන දින කැබිනට් මණ්ඩලය ගත් තීරණය මගින් මෙම ව්‍යාපෘතිය සඳහා වන ඉංජිනේරු උපදේශන සේවා ගිවිසුම් අත්සන් කිරීමටත් ව්‍යාපෘතියේ ඉදිරි ව්‍යාපෘති අවශ්‍යතා සම්පූර්ණ කිරීමටත් තීරණය කරන ලදි.

- ඒ අනුව 2025 මාර්තු මස 12 දින ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්, ඩිජිටල් අමාත්‍යාංශයේ වැඩබලන ලේකම්, ජපාන තානාපති කාර්යාල නිලධාරින්, ජයිකා ප්‍රධානින් ඇතුළු නිලධාරින් ඉංජිනේරු උපදේශන සේවා ආයතනයේ නිලධාරින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරයේ රැස්ව ව්‍යාපෘතියේ ඉංජිනේරු උපදේශන සේවා ගිවිසුම අත්සන් කර ගැනීම සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව කාරණා දීර්ඝ වශයෙන් සාකච්ඡා කර එකඟතාවයකට පැමිණෙන ලදි.

- කැබිනට් මණ්ඩල අනුමැතිය ලත් කමිටුවේ දෙවන රැස්වීම 2025.04.03 වන දින පැවැත්වූ අතර එහි කරුණු සාකච්ඡාවෙන් අනතුරුව අදාල උපදේශන සේවා ගිවිසුම යටියෝ ඉංජිනේරු උපදේශන සේවා ආයතනය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය එක්ව අත්සන් කරණු ලැබිණි. මෙම ගිවිසුමට JICA ආයතනයේ එකඟතාව (concurrence) 2025 මැයි මස 14 දින ලැබිණි. ඒ අනුව 2025 ජුනි 09 දින ඉංජිනේරු උපදේශන සේවා කටයුතු ආරම්භ කෙරිණි.

- 2025 ජුනි 09 දින ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීමෙන් පසුව, තාක්ෂණික ඉංජිනේරු කණ්ඩායම, උපදේශන කණ්ඩායම, ජනමාධ්‍ය අමාත්‍යාංශයේ නිලධාරින් හා ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් කුළුණු නිරීක්ෂණ සඳහා ක්ෂේත්‍ර පරික්ෂාවක් සිදු කළ අතර එහිදි මීට පෙර හඳුනාගත් ස්ථානයන් 16ක් පිළිබඳව මූලික අධ්‍යනයන් සිදු කරන ලදි. ඒ අනුව අවසන් ව්‍යාපෘති වාර්තා සැකසීම ආරම්භ කරන ලදි.

- ඉහත මූලික අධ්‍යනයන් මගින් යෝජිතව තිබු නව විකාශන කුළුණු 09ක් ඉදිකිරිම වෙනුවට දැනට පවතින කුළුණු භාවිතා කිරීමට තිරණය කරන ලදි. (එමගින් රුපියල් මිලියන 360 ක පමණ මුදලක් ඉතිරි කර ගැනීමට හැකිවනු ඇත)

- ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ අනුමත ව්‍යාපෘති කාර්ය මණ්ඩලය 27ක් වන අතර මින් 2025 වර්ෂය අවසන් වන විට 12ක කාර්ය මණ්ඩලයක් ව්‍යාපෘතියට බඳවාගෙන ඇත. මීට අමතරව ඉතිරි ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සම්පූර්ණයෙන්ම බඳවා ගැනීම සඳහා 2025.12.30 දිනැතිව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබා දි තිබේ.

- ව්‍යාපෘති කටයුතු සඳහා යොදා ගැනිමට අපේක්ෂිත ත්‍රිකුණාමල ප්‍රදේශයේ පිහිටා ඇති ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට අයත් කුළුණ සහ ගොඩනැගිලි ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා භාවිත කිරිම සම්බන්ධයෙන් එම ආයතනයේ නිලධාරින් හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තු නිලධාරින් සමග 2025.11.16 දින සාකච්ඡා ආරම්භ කරන ලදි.

- වසර අවසන් වන විට ප්‍රසම්පාදන කටයුතුවලට අදාල මූලික නිර්මාණ කටයුතු සහ දත්ත එක්රැස් කිරීමේ කටයුතුවල නිරත වෙමින් සිටී.

**2025 දෙසැම්බර් 31 දක්වා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය**

2025 වසර වෙනුවෙන් මුල්‍යකරණය ආශ්‍රිත දේශීය පිරිවැය සඳහා රු.මි. 50ක් හා විදේශීය ණය ලෙස රු.මි. 100ක් භාණ්ඩාගාරයෙන් ලබා දී තිබුණු අතර 2025 දෙසැම්බර් මස 31 දින දක්වා මෙම වර්ෂය තුළ දේශීය අරමුදලෙන් රු.මි. 36.26 ක වියදම් දරා ඇත. විදේශිය ණය රු.මි. 700 ක අතිරේක ප්‍රතිපාදනයක් ලබා ගෙන ඇති අතර ඒ අනුව 2025 වසර සඳහා වෙන්වූ මුළු විදේශීය ණය ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 800 කි. මින් 2025 දෙසැම්බර් 31 දිනට වියදම රු.මි. 562.03 කි.

| මූල්‍යකරණය | විස්තරය | ප්‍රතිපාදන 2025 (රු.මිලි.) | අතිරේක ප්‍රතිපාදන 2025 (රු.මිලි.) | මුළු ප්‍රතිපාදන (රු.මිලි.) | 2025 වර්ෂයට අදාල වියදම (රු.මිලි.) | ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|---|---|---|
| 17 | විදේශීය මූල්‍යකරණය ආශ්‍රිත දේශීය මූල්‍යකරණය | 50 | - | 50 | 36.26 | 73 |
| 12 | විදේශීය ණය | 100 | 700 | 800 | 562.03 | 70 |
| **එකතුව** | | **150** | **700** | **850** | **598.29*** | **70*** |

* 2025 වර්ෂයේ නොවැම්බර් සහ දෙසැම්බර් මාස වලට අදාලව විදේශීය ණය (12) යටතේ ගෙවීම් කළ යුතුව තිබූ රු.මි. 121.82 ගෙවීම් තාක්ෂණික හේතූන් මත 2026 ජනවාරි මාසයේදී ගෙවීමට සිදු විය. එම මුදලද 2025 වර්ෂයට අදාල වියදමට ඇතුළත්ව ඇත.

## 2.2 අභියෝග

### 2.2.1 රජයේ මාධ්‍ය ආයතනයන් ස්වයං මූල්‍ය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන ආයතන බවට පත් කිරීම.

රජයේ මාධ්‍ය ආයතන ස්වයං මූල්‍ය ආයතන බවට පත් කිරීමෙන් රාජ්‍ය මූල්‍ය බර අඩු කිරීම, කාර්යක්ෂමතාවය වැඩි කිරීම හා මාධ්‍ය ආයතනවල තරඟකාරීත්වය ඉහළ නැංවීම වැනි ප්‍රතිලාභ ලබාගත හැක. එහෙත්, එම ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී පොදු සේවා මාධ්‍යයක මූලික අරමුණු ආරක්ෂා කර ගනිමින්, මූල්‍ය ස්වාධීනත්වය සහ සමාජ වගකීම අතර සමතුලිතතාවයක් පවත්වා ගැනීම අත්‍යාවශ්‍ය වේ. මෙහිදී වාණිජමය හා කළමණාකරණමය කාර්යක්ෂමතාවය වැඩි කර ගැනීම අවශ්‍ය වන අතර ස්වකීය ආදායම් මඟින් නව තාක්ෂණය, ඩිජිටල් වේදිකා සහ නව මාධ්‍ය සේවා සංවර්ධන කර ගැනීමත් මඟින් පෞද්ගලික මාධ්‍ය ආයතන සමඟ තරඟ කිරීමේ ඉහළ ශක්‍යතාවයක් ගොඩනැගෙන අතර ඉහළ ප්‍රේක්ෂක සහ ශ්‍රාවක ආකර්ශනයක්ද ඇති කර ගත හැකි වනු ඇත.

### 2.2.2 සමාජ මාධ්‍යවල වේගවත් ව්‍යාප්තිය සහ ව්‍යාජ තොරතුරු පැතිරීම.

වර්තමාන ඩිජිටල් යුගයේ සමාජ මාධ්‍ය ජනතාවගේ තොරතුරු ලබා ගැනීමේ ප්‍රධාන මාර්ගයක් බවට පත්ව ඇත. ෆේස්බුක්, යූටියුබ්, ඉන්ස්ටග්‍රෑම්, ටික්ටොක් වැනි වේදිකා හරහා තත්පර කිහිපයක් ඇතුළත ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් අතරට තොරතුරු පැතිර යා හැකිය. මෙම වේගවත් ව්‍යාප්තිය තොරතුරු හුවමාරුව පහසු කළද, සත්‍යාපනය නොකළ හෝ ව්‍යාජ තොරතුරු පැතිරීමේ අවදානම විශාල ලෙස වැඩි කර ඇත. මෙවැනි ව්‍යාජ තොරුතුරු පැතිරීමේ ප්‍රධාන ප්‍රතිවිපාකයක් වන්නේ ජනතාවගේ විශ්වාසය පළුදුවීමයි. එමෙන්ම ව්‍යාජ තොරතුරු සමාජ අර්බුද සහ ගැටුම් ඇති කිරීමටද හේතු විය හැක. විශේෂ හෝ ජාතික ආගමික හෝ දේශපාලනික වශයෙන් සංවේදී කරුණු සම්බන්ධයෙන් පැතිරෙන අසත්‍ය තොරතුරු ජන කණ්ඩායම් අතර නොසන්සුන්තාව, වෛරය හා ගැටුම් වර්ධනය කළ හැක.

### 2.2.3 වෘත්තීය ආචාරධර්ම පිළිබඳ ගැටළු

ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ වෘත්තීය ආචාරධර්ම යනු මාධ්‍යවේදීන් සහ මාධ්‍ය ආයතන විසින් තොරතුරු රැස් කිරීම, සත්‍යාපනය කිරීම සහ ප්‍රචාරණය කිරීමේදී අනුගමනය කළ යුතු සදාචාරාත්මක සහ වෘත්තීය ප්‍රමිතීන්ය. සත්‍යතාව, නිරවද්‍යතාව, අපක්ෂපාතීත්වය, සාධාරණත්වය, වගකීම සහ පුද්ගලිකත්වයට ගරු කිරීම යන මූලධර්ම මෙහි මූලික අංග වේ. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ මෙම ආචාරධර්ම සම්බන්ධ තත්ත්වය ගැටළුකාරී බවට මත ඉදිරිපත් වේ.

වෘත්තීය ආචාරධර්ම පිළිපැදීම ජනමාධ්‍යයේ විශ්වාසනීයභාවය සහ ගුණාත්මකභාවය පවත්වාගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය වේ. මෙම අභියෝගාත්මක තත්ත්වය සාධනීය මට්ටමකට පත්වී යහපත් මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැඟීම තුළින් ජනතාවට විශ්වාසනීය තොරතුරු ලබාදීමටත් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් ශක්තිමත් කිරීමටත් හැකි වනු ඇත.

### 2.2.4 තාක්ෂණික හා වෘත්තීය පුහුණු මට්ටම

ජනමාධ්‍ය ක්ෂේත්‍රය වේගයෙන් වෙනස්වන තාක්ෂණික පරිසරයක් තුළ ක්‍රියාත්මක වේ. ඩිජිටල් මාධ්‍ය, සමාජ මාධ්‍ය දත්ත මාධ්‍යකරණය, කෘත්‍රිම බුද්ධිය, බහුමාධ්‍ය අන්තර්ගත නිර්මාණය සහ මාර්ගගත ප්‍රවෘත්ති වාර්තාකරණය වැනි නව ප්‍රවණතා හේතුවෙන් මාධ්‍යවේදීන්ට නිරන්තරයෙන් නව කුසලතා ලබාගැනීම අවශ්‍ය වී ඇත. මෙය ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවයට සහ තරඟකාරීත්වයට සෘජුවම බලපාන අභියෝගයකි.

### 2.2.5 සමාජ මාධ්‍ය භාවිතය ප්‍රචලිත වීමෙන් සාම්ප්‍රදායික ජනමාධ්‍ය ක්ෂේත්‍රය දැඩි පීඩනයකට ලක් වීම.

වර්තමාන ඩිජිටල් යුගයේ සමාජ මාධ්‍ය ජනතාවගේ තොරතුරු ලබා ගැනීමේ ප්‍රධාන මාර්ගයක් බවට පත්ව ඇත. මෙම තත්ත්වය හේතුවෙන් පුවත්පත්, ගුවන් විදුලි සහ රූපවාහිනී වැනි සාම්ප්‍රදායික ජනමාධ්‍ය ආයතන දැඩි තරඟයකට මුහුණු දී සිටී. ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය ක්ෂේත්‍රයට බලපාන ප්‍රධාන අභියෝග අතර සමාජ මාධ්‍ය සමඟ ඇති මෙම තරඟය ඉතා වැදගත් ස්ථානයක් ගනී.

### 2.2.6 ඩිජිටල් තාක්ෂණයට අනුගත වීම.

21 වන සියවසේ සන්නිවේදන තාක්ෂණික විප්ලවයත් සමඟ ජනමාධ්‍ය ක්ෂේත්‍රය විශාල පරිවර්තනයකට ලක් වී ඇත. සමාජ මාධ්‍ය, කෘත්‍රිම බුද්ධිය (AI) වැනි නව තාක්ෂණයන් හඳුන්වාදීම නිසා ජනතාව තොරතුරු ලබා ගන්නා ආකාරය සැලකිය යුතු ලෙස වෙනස් වී තිබේ. ඩිජිටල් තාක්ෂණයට අනුගත වීම ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය ක්ෂේත්‍රයට අභියෝගයක් මෙන්ම අවස්ථාවක්ද වේ. තාක්ෂණික වෙනස්කම් සමඟ ගමන් නොකළහොත් මාධ්‍ය ආයතනවලට තරඟකාරීත්වය පවත්වා ගැනීම අපහසු වනු ඇත.

ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය ක්ෂේත්‍රය ආර්ථික අර්බුද, ඩිජිටල් තරඟය, ව්‍යාජ පුවත්, වෘත්තීය ආචාරධර්ම සහ තාක්ෂණික වෙනස්කම් වැනි බහුවිධ අභියෝගවලට මුහුණදෙමින් සිටී. මෙම අභියෝග ජයගැනීම සඳහා ස්වාධීන මාධ්‍ය පරිසරයක් ගොඩනැඟීම, මාධ්‍යවේදීන්ගේ වෘත්තීය පුහුණුව වැඩිදියුණු කිරීම, ඩිජිටල්

පරිවර්තනය ශක්තිමත් කිරීම, ව්‍යාජ පුවත් පාලනය කිරීම සහ ජනතාවගේ මාධ්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීම අත්‍යාවශ්‍ය වේ.

සමස්තයක් ලෙස ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමටත්, ජනතාවට නිවැරදි සහ විශ්වාසනීය තොරතුරු ලබාදීමටත්, ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය ක්ෂේත්‍රය විසින් මෙම අභියෝග සාර්ථකව ජයගැනීම අතිශය වැදගත් වේ.

## 2.3 අනාගත ඉලක්ක

i. මාධ්‍ය නිදහස තහවුරු වන පරිදි වගකීම් හා වගවීම් සහිත මාධ්‍ය සදාචාරයක් බිහිකිරීම සඳහා අවශ්‍ය නියාමනයන් ක්‍රියාත්මක කිරීම.

ii. රටේ සියලු පුරවැසියන්ට තොරතුරු ලබාගැනීමේ ප්‍රවේශයන් පුළුල් කිරීම.

iii. මාධ්‍යවේදීන් දැනුමෙන් හා අත්දැකීමෙන් සන්නද්ධ කිරීම.

iv. මාධ්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම.

v. මාධ්‍ය ප්‍රතිපත්තියක් හඳුන්වා දීම.

vi. මාධ්‍ය ආචාරධර්ම පද්ධතියක් හඳුන්වාදීම.

ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

# 03 පරිච්ඡේදය

## 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

# 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

ආදායම් ගණන් දීමේ නිලධාරී : ලේකම්, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

වියදම් ශීර්ෂ අංකය : 111

රු.

| ආදායම් සංකේතය | ආදායම් විස්තරය | සටහන | ආදායම් ඇස්තමේන්තුව (1) | | ආදායම් රැස්කිරීම් (2) | | | (3) | ආදායමෙන් ආපසු ගෙවීම් (4) | | | (5) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | මූලික ඇස්තමේන්තුව | සංශෝධිත ඇස්තමේන්තුව | අදාළ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව විසින් රැස්කිරීම් | වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් රැස්කිරීම් (SA-21-1) | එකතුව | හිඟ ආදායම් රැස්කිරීම් | මුදලින් | වැරදි නිවැරදි කිරීම් | එකතුව | ශුද්ධ ආදායම |
| | | | 1(i) | 1(ii) | 2(i) | 2(ii) | 2(iii)=2(i)+ 2(ii) | (3) | 4(i) | 4(ii) | 4(iii)=4(i)+ 4(ii) | 5=2(iii)+ (3)-4(iii) |
| 1002.13.00 | වෙලිනාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩසටහන් බද්ද | | 130,000,000 | 130,000,000 | 92,822,000 | - | 92,822,000 | 5,897,800 | - | - | - | 98,719,800 |

....................
දිනය

....................................................
ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී /මුදල් අංශයේ ප්‍රධානී නම සහ අත්සන

....................................................
ආදායම් ගණන්දීමේ නිලධාරී නම, තනතුර සහ අත්සන

* තමන්ට අදාළ ආදායම් සංකේතය පමණක් ඇතුළත් වන පරිදි ආකෘති පත්‍රය සංශෝධනය කර ගත යුතු ය.

J.R. Denawaka
Chief Financial Officer - Mass Media
Ministry of Health and Mass Media
163, "Asidisi Medura"
Kirulapona Avenue, Polhengoda,
Colombo 05.

# 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශනය

ආදායම් ගණන් දීමේ නිලධාරි : ලේකම්, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

වියදම් ශීර්ෂ අංකය : 111

| පූර්ව මුදල් වර්ෂ 3 සඳහා ශුද්ධ ආදායම් රැස්කිරීම | | |
|---|---|---|
| වර්ෂය 1 | (2022) | රු. 215,020,000 |
| වර්ෂය 2 | (2023) | රු. 150,450,000 |
| වර්ෂය 3 | (2024) | රු. 123,750,000 |

රු.

| කාල පරිච්ඡේදය | ආදායම් සංකේතය | ආදායම් විස්තරය | වර්ෂ ආරම්භක ශේෂය (1) | වාර්තා කරනු ලබන වර්ෂයට අදාළ හිඟ මුදල් (2) | අයකර ගැනීම (3) | කපා හරින ලද හිඟ ආදායම් (4) | වර්ෂ අවසාන ශේෂය 5=(1)+(2)-[(3)+(4)] |
|---|---|---|---|---|---|---|---|
| (1) වාර්තා කරනු ලබන වසරට අදාළ හිඟ මුදල් | 1002.13.00 | ටෙලිනාට්‍ය, චිත්‍රපට හා වානිජ වැඩසටහන් බද්ද | | | | | |
| උප එකතුව | | | | | | | |
| (2) පසුගිය වසරට අදාළ හිඟ මුදල් | 1002.13.00 | ටෙලිනාට්‍ය, චිත්‍රපට හා වානිජ වැඩසටහන් බද්ද | | | | | |
| උප එකතුව | | | | | | | |
| (3) පසුගිය වසරට පෙර වසර වන විට හිඟ මුදල් | 1002.13.00 | ටෙලිනාට්‍ය, චිත්‍රපට හා වානිජ වැඩසටහන් බද්ද | 25,220,500 | | 5,030,000 | - | 20,190,500 |
| උප එකතුව | | | 25,220,500 | | 5,030,000 | - | 20,190,500 |
| එකතුව | | | 25,220,500 | - | 5,030,000 | - | 20,190,500 |

................. දිනය

........................................................ ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි /මුදල් අංශයේ ප්‍රධානි නම සහ අත්සන

........................................................ ආදායම් ගණන්දීමේ නිලධාරියාගේ අත්සන
ආදායම් ගණන්දීමේ නිලධාරියාගේ නම:
ආදායම් ගණන්දීමේ නිලධාරියාගේ තනතුර:

J.R. Denawaka
Chief Financial Officer - Mass Media
Ministry of Health and Mass Media
163, "Asidisi Medura"
Kirulapona Avenue, Polhengoda,
Colombo 05.

ඒසීඒ - 1(ii)

# මූලික ආදායම් ඇස්තමේන්තුව සහ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව අතර විචලතා පැහැදිලි කිරීම

ආදායම් ගණන් දීමේ නිලධාරි : ලේකම්, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

වියදම් ශීර්ෂ අංකය : 111

රු.

| ආදායම් සංකේතය | විස්තරය | මූලික ආදායම් ඇස්තමේන්තුව | සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව | වෙනස මූලික ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස | වෙනස්කම්වලට හේතු |
|---|---|---|---|---|---|
| **1002.13.00** | ටෙලිනාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩසටහන් බද්ද | 130,000,000 | 130,000,000 | - | - |

.................. දිනය

.................................................. ප්‍රධාන මූල්‍ය නිලධාරි /ප්‍රධාන ගණකාධිකාරි/ මුදල් අංශයේ ප්‍රධානි නම සහ අත්සන

.................................................................. ආදායම් ගණන්දීමේ නිලධාරියාගේ අත්සන
ආදායම් ගණන්දීමේ නිලධාරියාගේ නම:
ආදායම් ගණන්දීමේ නිලධාරියාගේ තනතුර:

J.R. Denawaka
Chief Financial Officer - Mass Media
Ministry of Health and Mass Media
163, "Asidisi Medura"
Kirulapona Avenue, Polhengoda,
Colombo 05.

ඒසීඒ - 1(iii)

# සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව සහ සත්‍ය ආදායම අතර විචලතා පැහැදිලි කිරීම

ආදායම් ගණන් දීමේ නිලධාරි : ලේකම්, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය    වියදම් ශීර්ෂ අංකය : 111

රු.

| ආදායම් සංකේතය | විස්තරය | සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව | සත්‍ය ආදායම | සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව හා සත්‍ය ආදායම අතර වෙනස | වෙනස සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස | වෙනස්කම්වලට හේතු |
|---|---|---|---|---|---|---|
| **1002.13.00** | ටෙලිනාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩසටහන් බද්ද | 130,000,000 | 98,719,800 | (31,280,200) | -24% | බදු ගෙවා විකාශනය කරනු ලබන ආනයනික ටෙලිනාට්‍ය, චිත්‍රපට හා වෙළඳ දැන්වීම් සීමා වීම. |

.................. ....................................................... ....................................................................

දිනය    ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/ මුදල් අංශයේ ප්‍රධානී නම සහ අත්සන

ආදායම් ගණන්දීමේ නිලධාරියාගේ අත්සන
ආදායම් ගණන්දීමේ නිලධාරියාගේ නම:
ආදායම් ගණන්දීමේ නිලධාරියාගේ තනතුර:

J.R. Denawaka
Chief Financial Officer - Mass Media
Ministry of Health and Mass Media
163, "Asidisi Medura"
Kirulapona Avenue, Polhengoda,
Colombo 05.

## වාර්තාකිරීමේ පදනම

1) පිළියෙල කිරීමේ අරමුණ

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.31 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) දේපොළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපොළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) දේපොළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපොළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

7) මුදල් හා මුදල් සමාන දෑ

2025 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවලදී එම ආකෘතිවල අවශ්‍ය පරිදි ංශෝධනයන් සිදුකරගත හැක. එසේම, "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාල ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

**3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය**

රු. ‘000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුදල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| 1002.13.00 | ටෙලිනාට්‍ය, චිත්‍රපට හා වානිජ වැඩසටහන් බද්ද | 130,000 | 130,000 | 98,719 | 76% |

**3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්යසාධනය**

රු. ‘000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 496,000 | 496,000 | 412,408 | 83% |
| ප්‍රාග්ධන | 228,000 | 928,000 | 429,624 | 46% |
| එකතුව | **724,000** | **1,424,000** | **842,032** | **59%** |

**3.7** මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. '000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 01. | මැතිවරණ කොමිසන් සභාව | මැතිවරණ කාර්ය මණ්ඩල ගෙවීම් | 859 | 859 | 857 | 99% |
| 02. | ජනාධිපති කාර්යාලය | ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන | 270,000 | 270,000 | 267,048 | 99% |
| 03. | ජනාධිපති කාර්යාලය | ආසියානු ශාන්තිකර කලාපීය විකාශන සංගමයේ දේශගුණික ක්‍රියාමාර්ග හා ආපාදා සූදානම පිළිබඳ සමුළුව | 20,000 | 20,000 | 20,000 | 100% |

**3.8** මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. '000

| වත්කම් කේතය | කේත විස්තරය | **2025.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | **2025.12.31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 57,533 | 57,533 | - | 100% |
| 9152 | යන්ත්‍රෝපකරණ | 452,585 | 452,585 | - | 100% |
| 9153 | ඉඩම් | 257,000 | 257,000 | - | 100% |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | - | - |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | - |

**3.9** විගණකාධිපති වාර්තාව

කාර්යසාධන වාර්තාවේ අවසානයේ අමුණා ඇත.

# 04 පරිච්ඡේදය

## කාර්යසාධන දර්ශක

# කාර්යසාධන දර්ශක

## 4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| | විශේෂිතවූ දර්ශක | තත්‍ය නිමැවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | | |
|---|---|---|---|---|---|
| | | 100% - 90% | 75% - 89% | 50% - 74% | 0% - 49% |
| 1 | විකාශන නීතිය කෙටුම්පත් කිරීම | ✓ | - | - | - |
| 2 | තොරතුරු දැන ගැනීමේ අයිතිය ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍ය නිලධාරීන් දැනුම්වත් කිරීම | ✓ | - | - | - |
| 3 | වෘත්තීය මාධ්‍යවේදීන් බිහි කිරීම | | | | |
| 3.1 | ඇසිදිසි ජනමාධ්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන | ✓ | - | - | - |
| 3.2 | මාධ්‍යවේදීන් සඳහා උසස් අධ්‍යාපන ආයතනයක් ස්ථාපිත කිරීම සඳහා පනත කෙටුම්පත් කිරීම (ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය) | ✓ | - | - | - |

# 05 පරිච්ඡේදය

## තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

# තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ

# කාර්යසාධනය

## 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

වගකීම් සහගත මාධ්‍ය සංස්කෘතියක් බිහිකිරීම සඳහා පහසුකම් සලසන අතරතුර මාධ්‍ය ක්‍රියාකාරිත්වයෙහි විශිෂ්ටත්වය කරා ප්‍රවිශ්ට වීම.

<table>
<tr><th rowspan="2">අරමුණ/<br>පරමාර්ථය</th><th rowspan="2">ඉලක්කය<br>(ගෝලීය ඉලක්කය)</th><th rowspan="2">සාක්ෂාත් කර ගැනීම<br>සඳහා වන දර්ශක</th><th colspan="3">වර්තමානය වන විට සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය</th></tr>
<tr><th>0%- 49%</th><th>50%- 74%</th><th>75%- 10%</th></tr>
<tr><td rowspan="2">4.<br>ගුණාත්මක අධ්‍යාපනය</td><td rowspan="2">4.4 2030 වන විට රැකියා, සුනිසි රැකියා සහ ව්‍යවසායකත්වය සඳහා අවැසි තාක්ෂණික සහ වෘත්තීය නිපුනතා ද ඇතුලු අදාල නිපුනතා සහිත තරුණ සහ වැඩිහිටි ජනගහනය ක්‍රමිකව වැඩි කිරීම.</td><td>ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය (Chartered Institute of Media Professionals – Sri Lanka) පිහිටුවීම සඳහා පනත් කෙටුම්පත සකස් කිරීම.</td><td></td><td></td><td>✓</td></tr>
<tr><td>ඇසි දිසි ජනමාධ්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන ක්‍රියාත්මක කිරීම.</td><td></td><td></td><td>✓</td></tr>
<tr><td rowspan="2">16. සාමය යුක්තිය සහ ශක්තිමත් ආයතන</td><td rowspan="2">16.10 ජාතික නීතිය සහ ජාත්‍යන්තර ගිවිසුම් ප්‍රකාරව තොරතුරුවලට මහජනතාවට ප්‍රවේශ වීමේ හැකියාව සහතික කොට මූලික නිදහස තහවුරු කරලීම.</td><td colspan="4">තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මක කිරීම</td></tr>
<tr><td>අ) පුහුණුකරුවන් පුහුණු කිරීම</td><td></td><td></td><td>✓</td></tr>
</table>

| | | | | | |
|---|---|---|---|---|---|
| | | ආ) තොරතුරු නිලධාරීන් සහ රාජ්‍ය නිලධාරීන් පුහුණු කිරීම (අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධ සියලු ආයතන සඳහා) | | | ✓ |
| | | ඇ) ජාත්‍යන්තර තොරතුරු දිනය වෙනුවෙන් වැඩමුළුවක් සංවිධානය | | | ✓ |
| | | ඈ) තොරතුරු නිලධාරීන් සඳහා අත්පොත් මුද්‍රණය කර බෙදාහැරීම | | | ✓ |

**5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග**

**ජයග්‍රහණ :**

i. ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ සේවයේ නියුතු මාධ්‍යවේදීන්ගේ වෘත්තීයභාවය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය (Chartered Institute of Media Professionals of Sri Lanka) යන මැයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට සමාන්තර ස්වාධීන ආයතනයක් මහා බ්‍රිතාන්‍යයේ දැනට ස්ථාපිත වරලත් ජනමාධ්‍ය ආයතනය පදනම් කරගනිමින් රාජ්‍ය අනුග්‍රහය සහිතව ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත. ඒ සඳහා අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී ඇති අතර, Chartered Institute of Media Professionals of Sri Lanka Bill කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක විසින් කෙටුම්පත් කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති අතර එම කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක විසින් නීතිපතිගේ නිශ්කාෂණ සහතිකය ලබා ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

ii. තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත ක්‍රියාත්මක කර එය සමාජගත කිරීමේ වගකීම මෙම අමාත්‍යාංශය විසින් දරනු ලබන අතර මෙම ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමෙහිලා මේ සඳහාම වෙන්වූ ඒකකයක් අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇත. පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධ සියළු කටයුතු මෙම ඒකකය හරහා සිදු කෙරේ. තවද 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි 11 වන වගන්තිය ප්‍රකාරව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව පොදු අධිකාරීන් සුපරීක්ෂණය කිරීමෙහි සහ තොරතුරු නීතිය බලාත්මක කිරීමේ ආයතනය වශයෙන් ස්ථාපිත කරන ලදී.

**අභියෝග :**

i. රාජ්‍ය ආයතන අතර සුසංයෝගයක් ඇති කර ගැනීම හරහා සාමූහික ක්‍රියාමාර්ග හඳුනා ගැනීම හා ඒකාබද්ධ සැලසුම්කරණයකට ප්‍රවිෂ්ඨ වීම.

ii. තාක්ෂණයේ ප්‍රගමනයත් සමඟ මාධ්‍ය ක්ෂේත්‍රයට සරිලන පරිදි රාජ්‍ය මාධ්‍ය ආයතන නවීන තාක්ෂණයෙන් සවිබල ගැන්වීම.

iii. මෙම ඉලක්ක සපුරා ගැනීම සඳහා පෞද්ගලික මාධ්‍ය මෙන්ම සමාජ මාධ්‍ය කාර්යක්ෂමව යොදා ගැනීම.

iv. තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී මාධ්‍ය සහය ලබාදීමට රාජ්‍ය මාධ්‍ය ආයතන සඳහා ප්‍රමාණවත් තරම් ප්‍රතිපාදන නොලැබීම.

v. අනුමත කාර්ය මණ්ඩලය සම්පූර්ණ කර ගැනීම මෙතෙක් ඉටු කරගත නොහැකිවීමෙන් ඵලදායි ක්‍රියාකාරිත්වයට බාධා පැමිණීම.

vi. පොදු අධිකාරින් හා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව සම්බන්ධකර ජාලගතකිරීම අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් සිදුකිරීම.

vii. මහජන සම්බන්ධතාවය නිරතුරුව සිදුකිරීමට අවශ්‍ය පහසුකම් සහිත ඒකකයක් පිහිටුවීම.

viii. අන්තර්ජාතික මට්ටමේ මාධ්‍ය වෘත්තිකයන් බිහි කිරීම.

ix. රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශය සමඟ විශිෂ්ඨ ගුණාත්මක මාධ්‍ය සංස්කෘතියක් බිහි කිරීම.

x. නව මාධ්‍ය අනිසි ලෙස යොදා ගැනීම වළක්වා මාධ්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම මඟින් මාධ්‍ය හරහා සිදුවන හිංසනයන් හා අපචාර අවම කිරීම.

# 06 පරිච්ඡේදය

## මානව සම්පත් පැතිකඩ

# මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| කාණ්ඩය | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 24 | 14 | 10 |
| තෘතීයික | 05 | 03 | 02 |
| ද්විතියික | 97 | 67 | 30 |
| ප්‍රාථමික | 31 | 20 | 10 |
| **එකතුව** | **157** | **104** | **52** |

**6.2** ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම

ක්‍රියාවලීන් පවත්වාගෙන යාමේදී විවිධ දුෂ්කරතාවන් මධ්‍යයේ පවත්වාගෙන යාමට සිදුවේ.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

| පාඨමාලා/ පුහුණු වැඩසටහනෙහි නම | පුහුණු කරන ලද කාර්ය මණ්ඩලය | වැඩසටහන් කාලය | මුළු ආයෝජනය (රු.) | | වැඩසටහනෙහි ස්වභාවය (විදෙස් / දේශීය) | සාක්ෂාත් කරගත් ප්‍රතිඵල/දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදෙස් | | |
| රියදුරු පුහුණු වැඩමුළුව | 10 | දින 01 | 13,775.00 | - | දේශීය | රියදුරු සේවාවේ වගකීම, කාර්යභාරය හා ආචාරධර්ම පිළිබඳව රියදුරන් දැනුම්වත් කිරීම |
| වැටුප් පරිවර්තන වැඩමුළුව | 4 | දින 02 | 52,000.00 | - | දේශීය | වැටුප් සකස් කිරීම පිළිබඳව (Payroll Training) අමාත්‍යාංශයේ දැනුම්වත් කිරීම |
| භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන කටයුතු සඳහා නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හඳුන්වා දීම. | 1 | දින 02 | 13,000.00 | - | දේශීය | රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් මූලික අවබෝධයක් ලබා දීම |
| ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි | 1 | දින 02 | 13,000.00 | - | දේශීය | කාර්යක්ෂමතා කඩඉම් විභාගය මූලික කරගෙන සංවර්ධන නිලධාරීන් හා කළමනාකරණ සේවා නිලධාරීන් පුහුණු කිරීම |
| ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන | 250 | දින 01 | 62,875.00 | - | දේශීය | ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහනෙහි මූලික පරමාර්ථ පැහැදිලි කිරීම |
| නව ප්‍රසම්පාදන ක්‍රමවේදය පිළිබඳ දැනුම්වත් කිරීමේ බාහිර පැවති එක්දින පුහුණු වැඩසටහන | 5 | දින 01 | 92,500.00 | - | දේශීය | ආයතනික ප්‍රසම්පාදන කටයුතු කාර්යක්ෂමව හා සඵලදායිව පවත්වාගෙන යාම සහ සේවාවේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම |
| අභ්‍යන්තර කටයුතු ඒකකය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන | 58 | දින 01 | 14,021.66 | - | දේශීය | අභ්‍යන්තර කටයුතු පිළිබඳ නිලධාරීන් දැනුම්වත් කිරීම. |
| ජාත්‍යන්තර සබඳතා පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 1 | වසර 01 | 154,775.00 | - | දේශීය | ජාත්‍යන්තර සබඳතා පිළිබඳ දැනුම්වත් වීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| බදු පිළිබඳ පාඨමාලාව | 2 | මාස 6 | 190,000.00 | - | දේශීය | බදු පිළිබඳ නිලධාරීන්ට දැනුම ලබාදීම. |
| නව ප්‍රසම්පාදන පුහුණු වැඩසටහන | 158 | දින 02 | 560,131.55 | - | දේශීය | ආයතනික ප්‍රසම්පාදන කටයුතු කාර්යක්ෂමව හා සඵලදායිව පවත්වාගෙන යාම සහ සේවාවේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම |
| රාජ්‍ය නිලධාරීන්ගේ විනය පාලනය සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යපටිපාටික රීති - II වන කොටස සම්පාදනය කිරීම | 2 | දින 01 | - | - | දේශීය | ආයතනික නිලධාරීන්ගේ විනය පාලනය පිළිබඳ දැනුම්වත් කිරීම |
| අවදානම් කළමනාකරණ රාමුව සහ අභ්‍යන්තර පාලනය පිළිබඳ පුහුණු වැඩසටහන සඳහා අවදානම් කමිටු සාමාජිකයන් නම් කිරීමේ පුහුණුව | 4 | දින 01 | - | - | දේශීය | අවදානම් කළමනාකරණ සහ අභ්‍යන්තර පාලනය පිළිබඳ නිලධාරීන් පුහුණු කිරීම |
| රියදුරු පුහුණු වැඩමුළුව | 10 | දින 01 | 9,400.00 | - | දේශීය | රියදුරු සේවාවේ වගකීම, කාර්යභාරය හා ආචාරධර්ම පිළිබඳව රියදුරන් දැනුවත් කිරීම |
| ලිපිගොනුකරණය හා රාජකාරි ලිපි ලිවීම | 23 | දින 01 | 101,800.00 | - | දේශීය | කාර්යක්ෂමතා කඩඉම් විභාගය මූලික කරගෙන සංවර්ධන නිලධාරීන් හා කළමනාකරණ සේවා නිලධාරීන් පුහුණු කිරීම |
| Excel පුහුණු පාඨමාලාව | 4 | දින 02 | 60,000.00 | - | දේශීය | Advanced Excel පිළිබඳව නිලධාරීන්ට දැනුම ලබාදීම. |
| ලිපිගොනුකරණය හා රාජකාරි ලිපි ලිවීම | 24 | දින 01 | 102,000.00 | - | දේශීය | කාර්යක්ෂමතා කඩඉම් විභාගය මූලික කරගෙන සංවර්ධන නිලධාරීන් හා කළමනාකරණ සේවා නිලධාරීන් පුහුණු කිරීම |
| **උප එකතුව** | **557** | | **1,439,278.21** | | | |

| පාඨමාලා/ පුහුණු වැඩසටහනෙහි නම | පුහුණු කරන ලද කාර්ය මණ්ඩලය | වැඩසටහන් කාලය | මුළු ආයෝජනය (රු.) | | වැඩසටහනෙහි ස්වභාවය (විදෙස් / දේශීය) | සාක්ෂාත් කරගත් ප්‍රතිඵල/දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| Capacity Building on Digital Governance in India | 01 | සති 02 | - | 92,187.38 | විදෙස් | ඉන්දියාවේ ඩිජිටල් පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම |
| Seminar on New Productive forces in Media of Indian Ocean region countries | 01 | සති 02 | - | 146,923.17 | විදෙස් | ඉන්දියානු සාගර කලාපයේ රටවල මාධ්‍ය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගැනීම හා නව මාධ්‍ය පිළිබඳ අවබෝධය ලබා ගැනීම |
| Seminar on Public Financial Management for Sri Lanka | 01 | සති 02 | - | 146,948.06 | විදෙස් | ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය කාර්යක්ෂම කිරීම පිළිබඳ අවබෝධය ලබා ගැනීම |
| උප එකතුව | **03** | **-** | **-** | **386,058.61** | - | |
| එකතුව | **560** | **-** | - | **1,825,336.82** | - | |

### 6.4 ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන්වල දායකත්වය

අදාළ විෂයන්හි නිලධාරීන්ගේ ප්‍රවීණත්වය ඉහළ නැංවීමට පුහුණු වැඩසටහන් යොදා ඇත. ඒ අනුව, ආයතනයේ කාර්ය සාධනයේ හා මහජන සේවා සැපයීමේ කාර්යක්ෂමතාවයේ ඉහල යාමක් සිදුවී ඇත.

# 07 පරිච්ඡේදය

## අනුකූලතා වාර්තාව

# අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | ශීර්ෂ අංක 111 ට අදාළ ගිණුම් සැකසීම සඳහා තොරතුරු සෞඛ්‍ය අංශයට ඉදිරිපත් කර ඇත. | - | - |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | | - | - |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නොවේ. | - | - |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ. | - | - |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ. | - | - |
| 1.6 | වෙනත් | අදාළ නොවේ. | - | - |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | - | - |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ. | - | - |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA –N 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |
| **03** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රේ 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම. | අනුකූල වේ. | - | - |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුම්වත් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම. | අනුකූල වේ. | - | - |
| 3.4 | 2014.05.11 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 171/2004 අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම. | අනුකූල වේ. | - | - |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ. | - | - |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ. | - | - |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ. | - | - |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) | අනුකූල වේ. | - | - |
| 4.5 | නියමිත දිනට ඉදිරිපත් කිරීම. | සෞඛ්‍ය අංශය විසින් ඉදිරිපත් කෙරේ. | - | - |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම. | අනුකූල වේ. | - | - |

| | | | | |
|---|---|---|---|---|
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ.134 (2)DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ. | - | - |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම. | අනුකූල වේ. | - | - |
| 6.3 | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම. | අනුකූල වේ. | - | - |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ ඉහත චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම. | අනුකූල වේ. | - | - |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම. | අනුකූල වේ. | - | - |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ. | - | - |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම. | අනුකූල වේ. | | - |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව | අනුකූල වේ. | - | - |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම. | අනුකූල වේ. | - | - |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ. | - | - |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල්කර තිබීම. | අනුකූල වේ. | - | - |

| | | | | |
|---|---|---|---|---|
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ. | - | - |
| 11.2 | මු.රෙ.94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම. | අනුකූල වේ. | - | - |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම. | අනුකූල වේ. | - | - |
| 12.2 | හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ. | - | - |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | සෞඛ්‍ය අංශය විසින් සිදු කරයි. | - | - |
| 14.2 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාරිය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 14.3 | මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | සෞඛ්‍ය අංශය විසින් සිදු කරයි. | - | - |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම. | අනුකූල වේ. | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 15.3 | මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම. | අනුකූල වේ. | - | - |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම. | අනුකූල වේ. | - | - |
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ. | - | - |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ. | - | - |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම. | අනුකූල වේ. | - | - |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය | - | - | - |

| | | | | |
|---|---|---|---|---|
| | කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ. | - | - |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ. | - | - |
| 19.3 | ඉහත 19.1 යටතේ සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෝෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම. | අනුකූල වේ. | - | - |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ. | - | - |

# විගණකාධිපති වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | එම්ඊඩී/බී/එම්ඔඑච්/ 02/2025/14 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2026 මැයි 29 දින |

2326575
01 JUN 2026
CFO-III

ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශය
02 JUN 2026
ලිපි අංශය

කේ.කේ.එස්. ජයකොඩි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත :- රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය

FCCD
1007
02 JUN 2026
ආරක්ෂණ හා සම්බන්ධීකරණ අංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

එම්ඊඩි/බී/එම්ඔඑච්/2026 මැයි 29 දින
02/2025/14

ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

**ශීර්ෂය 111 - සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය නොවන වත්කම්**

(ඕ) අවුරුදු 5ත් 15ත් අතර කාල පරාසයක් ඇතුළත, අයිතිය ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පැවරී ඇති වාහන 3ක පිරිවැය වන රු.මිලියන 128 ක අගය මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර නොතිබිම හේතුවෙන් එම වටිනාකමෙන්, මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

(ක) ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් 2025 දෙසැම්බර් 31 දින වන විට තැපැල් දෙපාර්තුමේන්තුව වෙත පවරා දී තිබුණු වාහන 4ක පිරිවැය වූ රු.මිලියන 20.20 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර තිබීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම්හි වටිනාකම එම වටිනාකමින් වැඩියෙන් පෙන්නුම් කර තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 ආදායම් කළමනාකරණය**

(අ) 2024 වර්ෂයේ ටෙලි නාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩසටහන් බද්ද මඟින් ලබා ගත් ආදායම රු. මිලියන 121.4ක් වූ අතර 2025 වර්ෂයේ එය රු. මිලියන 94.15ක්වීමෙන් 2024 වර්ෂයට සාපේක්ෂව සියයට 22.4 කින් ආදායම අඩු වී තිබුණි.

(ආ) පෞද්ගලික ආයතන දෙකකින් අය විය යුතු රු. මිලියන 20ක මුදල වර්ෂ 12 සිට 19 දක්වා කාලයක සිටහිඟව පැවති අතර 2026 මාර්තු 31 දින වනවිටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 අගෝස්තු 13 දිනැති අංක 12/1037/37/019-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ප්‍රවෘත්ති වෙබ් අඩවි ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ලියාපදිංචිය සහ වාර්ෂිකව අළුත් කිරීම සිදු කළ යුතු වුවත් 2024 වර්ෂයේ ලියාපදිංචිය අළුත් නොකළ වෙබ් අඩවි 19ක් සඳහා රු.190,000ක් ද සමාලෝචිත වර්ෂය සඳහා රු.300,000ක් ද අහිමි වී තිබුණි.

(ඈ) 2024 වර්ෂයේ ලියාපදිංචි නව වෙබ් අඩවි ප්‍රමාණය 30ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දී එය 16ක් පමණක් විය. එලෙස ලියාපදිංචිය සියයට 50කට ආසන්න ප්‍රමාණයකින් අඩු වී

තිබුණු අතර ආරක්ෂක අමාත්‍යාංශය යටතේ අවශ්‍ය නිශ්කාෂණ ලැබීමේ ප්‍රමාදය ඊට හේතු වන බවත් වෙබ් අඩවි 24කට නිශ්කාෂණ ලැබීමේ ප්‍රමාදයක් පවතින බවත් නිරීක්ෂණය විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයට අදාළව රු.240,000ක සෘජු ආදායමක් අහිමි වී ඇති බව නිරීක්ෂණය විය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.3 වත්කම් කළමනාකරණය**

(ඔ) අයිතිය ජන මාධ්‍ය අමාත්‍යාංශය සතු වුවද මෙම වාර්තාවේ දිනය දක්වා ගිණුම් ගත නොකළ පිරිවැය රු.39,500,000 ක් වූ අංක CAD-6806 දරන රථය 2024 වර්ෂයේදී ඇතිවූ දෝෂයක් හේතුවෙන් යාන්ත්‍රික ඉංජිනේරු විසින් අලුත්වැඩියා ආයතනයක් වෙත යොමුකර තිබුණු අතර 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුකූලව රථයක අභ්‍යන්තර අලුත්වැඩියාව සඳහා යාන්ත්‍රික ඉංජිනේරුවකුගේ වර්තාවක් ලබා ගත යුතු වුවද එයට අනුකූල නොවන පරිදි අදාළ ආයතනයට රු.15,000 ගෙවා රථය ගලවා තිබුණි. අලුත්වැඩියාවෙන් තොරව මාසයකට පසුව වාහනය අමාත්‍යාංශය වෙත නැවත භාරදී තිබුණු අතර භාරදෙන අවස්ථාවේ පැවති තත්ත්වය පිළිබඳව නිසි ක්‍රමවේදයක් ඔස්සේ පරීක්ෂාවට ලක් කිරීමට අවශ්‍ය කටයුතු කිරීමට අමාත්‍යාංශ ප්‍රවාහන භාර නිලධාරියා කටයුතු කර නොතිබුණි. තවද මෙම රථය අලුත්වැඩියාව වෙනුවෙන් 2025 දෙසැම්බර් 31 දින වන විට රු.4,274,849ක වියදමක් දරා තිබුණි. මෙම වියදම 2024 ජනවාරි 10 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ 01/2024 හා අනුකූල නොවන බව නිරීක්ෂණය විය.

**4.8 කළමනාකරණ දුර්වලතා**

(ඩ) වර්ෂ දෙකහමාරක කාලයක සිට සකස් කර ඇති, 2022 ජුලි 22 දිනැති අංක 2289/43 දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව ජනමාධ්‍ය අමාත්‍යාංශයේ සුවිශේෂ කාර්යයක් හා කර්තව්‍යක් ලෙස හඳුනාගෙන ඇති ජනමාධ්‍ය ප්‍රතිපත්තිය මෙම වාර්තාවේ දිනය දක්වා ස්ථාපිත කර නොතිබුණු අතර ප්‍රතිපත්ති සකස් කිරීමේ කාර්යය වෙනුවෙන් රු. 239,617ක් වැය කර තිබුණි.

(ඬ) ඇසිදිසි ජනමාධ්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන 2006 වර්ෂයේ සිට 2025 දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක කර තිබුණු අතර 2019 සිට 2023 දක්වා මාධ්‍ය ශිෂ්‍යත්ව ප්‍රතිලාභ ලබාගත් මාධ්‍යවේදීන් ගණන 116 ක් සඳහා රු. 19,954,711ක් වැය කර තිබුණි. 2019 වර්ෂයේ සිට 2023 දක්වා ශිෂ්‍යත්ව ලබාදුන් 116 දෙනාගෙන් 46 දෙනෙකු පමණක් පාඨමාලා අවසන් කර සහතිකපත් ලබා දී තිබුණු අතර 70 දෙනෙකු පාඨමාලා සම්පූර්ණ කර සහතිකපතෙහි පිටපතක් ජනමාධ්‍ය අංශය වෙත ලබා දී නොතිබුණි. පාඨමාලා නිසි පරිදි සම්පූර්ණ නොකර ශිෂ්‍යත්වලාභීන් පිළිබඳ නිවැරදි අධීක්ෂණයක් සිදු කර ගිවිසුම් ප්‍රකාරව එම පාඨමාලා ගාස්තු අය කර ගැනීමට හෝ නිසි ක්‍රියාමාර්ග ගැනීමට හෝ මෙම වාර්තාවේ දිනය දක්වා කටයුතු කර නොතිබුණි.

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
சுகாதார மற்றும் வெகுசன ஊடக அமைச்சு
**Ministry of Health and Mass Media**

ජනමාධ්‍ය අංශය
வெகுசன ஊடகப் பிரிவு
Mass Media Division

අංක. 163, ඇසිදිසි මැදුර, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05
இல. 163, அசிதிசி மெதுர, கிருளப்பனை மாவத்தை, பொல்ஹேன்கொடை, கொழும்பு 05
No. 163, Asi Disi Medura, Kirulapone Mawatha, Polhengoda, Colombo 05

දුරකථන / தொலைபேசி / Telephone
011-2513 459, 011-2512 321, 011-2513 498